# ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

## වාර්ෂික වාර්තාව

## 2016

---

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

**ජා.මැ.ස්.අ./6/වාර්ෂික වාර්තාව/2016** **2017-12-19**

**ගරු මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමා**

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය,

සොබාදම් පියස,

416/C/1, රොබට් ගුණවර්ධන මාවත,

බත්තරමුල්ල.

ගරු ඇමතිතුමණි,

# 2016 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව

------------------------------------------------------------------------

1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ පනතේ 32(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) වගන්තිය ප්‍රකාර පහත සඳහන් ලිපි මේ සමග ඉදිරිපත් කරමි.

1. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2016 වර්ෂය සඳහා වූ පාලන වාර්තාව.
2. විගණකාධිපති විසින් විධිමත් පරිදී විගණනය කරන ලද අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය සහ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශණය.
3. විගණකාධිපති වාර්තාව

ස්තුතියි

මෙයට විශ්වාසී,

**ආචාර්ය කිත්සිරි දිසානායක**

සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

# අපගේ දැක්ම

## “ශ්‍රී ලංකාව - මැණික් අගනුවර”

# අපගේ මෙහෙවර

**මැණික් හා ස්වර්ණාභරණ අංශය සංවර්ධනය, ප්‍රවර්ධනය හා විධිමත් කිරීම තුලින් ජාතික ධනය ඉපදවීම හා කර්මාන්තයට සම්බන්ධවුවන් අතිශයින් සතුටුකිරීමෙන් කර්මාන්තය විශිෂ්ඨත්වය කරා ලගා කරවීම.**

## මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය

## 2016 වර්ෂය

----------------

| | | | පත්වූ දිනය | විශ්‍රාම ගත්දිනය |
|---|---|---|---|---|
| 1 | අසංක සංජීව වෙළගෙදර මහතා - සභාපති, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | සභාපති | **2015.11.18** | |
| 2 | නවරත්න බණ්ඩාර අලහකෝන් මහතා - සභාපති, මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය | සාමාජික | **2015.02.24** | |
| 3 | ඒ.කේ.ඒ. සෙනෙවිරත්න මහතා - අතිරේක ලේකම්, වාණිජ කර්මාන්ත අමාත්‍යාංශය | සාමාජික | **2015.03.03** | **2016.12.19** |
| 4 | එන්. ගොඩකන්ද මෙනෙවිය - අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරන සේවා දෙපාර්තමේන්තුව | සාමාජික | **2015.04.23** | 2016.09.28 |
| 5 | ටී. එම්. ජේ. වයි. පී. ප්‍රනාන්දු මහතා - විනිමය පාලක, ශ්‍රී ලංකා මහ බැංකුව | සාමාජික | **2015.11.20** | |
| 6 | ඉන්දිරා මල්වත්ත මෙනෙවිය - සභාපති, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය | සාමාජික | **2015.12.02** | |
| 7 | ඩබ්.ඒ. චූලානන්ද පෙරේරා මහතා - අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව | සාමාජික | **2016.01.04** | |
| 8 | එච්. ජී. සුමනසිංහ මහතා - අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරන සේවා දෙපාර්තමේන්තුව | සාමාජික | **2016.11.09** | |
| 9 | ජී.එච්.ඒ. පෙරේරා මහතා - | සාමාජික | **2016.01.05** | |
| 10 | බී. ජී. ඉන්දික කුමුදු සමරවීර මහතා | සාමාජික | **2015.05.26** | |
| 11 | එස්.ඒ.ඩී. උපාලි සිරිලාල් සුරවීර මහතා | සාමාජික | **2016.01.26** | |
| 12 | එන්.බී. වැගොඩපොල මහතා | සාමාජික | **2015.01.30** | **2016.07.26** |
| 13 | රාජා පීරිස් මහතා | සාමාජික | **2015.01.30** | |

| මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ<br>ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මණ්ඩලය<br>2016 වර්ෂය | | | |
|---|---|---|---|
| | නම | | තනතුරු නාමය |
| 1 | අසංක සංජීව වෙළගෙදර මහතා | BSc. M Phill (පේරාදෙණිය විශ්ව විද්‍යාලය) | සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි |
| 2 | පී.එන්.එම්. වික්‍රමසිංහ මහතා | SLAS – පළමු පන්තිය | අධ්‍යක්ෂ ජනරාල් |
| 3 | කේ.එල්.ඩී.දයාසාගර මහතා | M.Sc. (පේරාදෙණිය විශ්ව විද්‍යාලය)FGA(ලන්ඩන්), D.Gem,G(ජර්මනි)MCA (ශ්‍රී ලංකාව ) | අධ්‍යක්ෂ (තක්සේරු හා රත්න විද්‍යාව) |
| 4 | ජී.ඩබ්. අමරසිරි මහතා | B.Sc.Eng(Minning), IESL (AM) | අධ්‍යක්ෂ (ඉඩම් කැණීම් හා පරිසර) |
| 5 | ටී.ඩී. කුලනන්ද මහතා | B.Sc. ( රාජ්‍ය පරිපාලන) | අධ්‍යක්ෂ (ජාතික ක්‍රියාත්මක හා ප්‍රාදේශීය සංවර්ධන) |
| 6 | ඒ.එන්.බී.පෙරේරා මහත්මිය | ACA, FMAAT | අධ්‍යක්ෂ (මූල්‍ය) |
| 7 | එස්.ඒ.ටී. බණ්ඩාර මහතා | B.Sc., M.I.Chem C,PGD (Gemmology) | අධ්‍යක්ෂ(රන් ප්‍රමාණය නිශ්චය කිරීම හා ප්‍රමිති මුද්‍රා) |
| 8 | පී.ඒ.කේ. තේනුවර මහතා | MPM, B.com(sp), HNDA, FMAAT | අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) |

# 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය යටතේ 2016 වසර සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පාලන වාර්තාව

**01.** 2016 වසර ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 22 වන වසර සනිටුහන් කරයි. සමාලෝචිත වර්ෂය තුල එහි කාර්ය භාරය මෙහෙයවන ලද්දේ රත්නපුර පිහිටි ප්‍රධාන කාර්යාලය හා කොළඹ කාර්යාලය සහ රත්නපුරය, ඇහැලියගොඩ, මාතර, නාවුල සහ මොනරාගල ප්‍රාදේශීය ඒකක මෙන්ම කටුනායක මැණික් අපනයන මධ්‍යස්ථානය සහ ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ පිහිටුවා ඇති මැණික් හා ස්වර්ණාභරණ හුවමාරු මධ්‍යස්ථානය මගිනි.

**02.** <u>අධිකාරියේ කර්තව්‍යයන්</u>

(අ) මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම;

(ආ) මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා යෝජනා ක්‍රම ආරම්භ කර ක්‍රියාත්මක කිරීම;

(ඇ) ශ්‍රී ලංකාව ඇතුලත හෝ ඉන් පිටත හෝ මැණික් හා ස්වර්ණාභරණ සඳහා වු වෙළඳපොළ පුළුල් කිරීම සහ මැණික් හා ස්වර්ණාභරණ සඳහා ලෝක වෙළඳපොලේ ඉල්ලුම ප්‍රවර්ධනය කිරීම;

(ඈ) මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය දියුණු කිරීමේ අදහසින් එම කර්මාන්තවලට අදාල සෑම අංශයකම සේවක පිරිස් වලට කාර්මික පුහුණුව, විශේෂයෙන් තාපයෝජනය සහ මැණික් කැපීම පිළිබඳව පුහුණුව ප්‍රවර්ධනය කිරීම සහ ඊට අනුග්‍රහය දැක්වීම;

(ඉ) අනාගත ගැණුම්කරුවන් තුල මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය කෙරෙහි විශ්වාසය ඇති කිරීමට අවශ්‍ය වියහැකි පියවරයන් ගැනීම;

(ඊ) නීති විරෝධි මැණික් ගැරීම සහ නීති විරෝධි ලෙස මැණික් ශ්‍රී ලංකාවෙන් ඉවත් කිරීම වැලැක්වීම;

(උ) පතල් කැණීමේ හෝ මැණික් ගැරීමේ අයිතිවාසිකම් යම් ආරක්ෂා කිරීමක් හේතුවෙන් හෝ අන්‍යාකාරයකින් රජය වෙත රැදී ඇති අවස්ථාවල රජයේ ඉඩම්වල හෝ ඒ මත හෝ රජය විසින් හෝ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් බැහැර කරන ලද

ඉඩම්වල හෝ ඒ මත මැණික් පතල් කැණීමේ අයිතිවාසිකම් අන්සතු කරදීම පිළිබඳව වගකිවයුතු එකම බලධරයා වශයෙන් ක්‍රියා කිරීම;

(ඌ) මැණික් හා ස්වර්ණාභරණ අලෙවි කිරීමට අවශ්‍ය කාර්මික සහ වෙනත් උපදෙස් සහ යටිතල පහසුකම් සැපයීම;

(එ) යම් උපලේඛන ගත ලිඛිත නීතියක් යටතේ පාලනය සඳහා පමණක්,

i එය මැණික් හෝ මැණික් කර්මාන්තය සම්බන්ධයෙන් අදාල වනතාක් දුරට, හෝ

ii මේ පනත යටතේ අධිකාරියේ බලතල. කර්තව්‍ය සහ කාර්යය අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවනතාක් දුරට එම නීතියේ කාර්ය පරිපාලනය කිරීම;

(ඒ) මැණික් සහ වටිනා ලෝහ වර්ග සහතික කිරීම සඳහා කාර්යාල පිහිටුවීම:

(ඔ) නිෂ්පාදිතයකුගේ ඉල්ලීම පිට, සපයනු ලබන ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත ස්වර්ණාභරණ නියමිත ආකාරයකට විශේෂ ලකුණකින් මුද්‍රා තබන බවට වගබලා ගැනීම;

(ඕ) ශ්‍රී ලංකාවේ මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය කිරීම උදෙසා මැණික් කර්මාන්තය, ස්වර්ණාභරණ කර්මාන්තය සහ රජයේ දෙපාර්තමේන්තු අතර මනා සම්බන්ධීකරණයක් ගොඩනැගුම හා එම සම්බන්ධීකරණයක් ගොඩනැගීම හා එම සම්බන්ධීකරණ ක්‍රියාදාමයන් තවදුරටත් වර්ධනය කිරීමේ අතරමැදියා වශයෙන් කටයුතු කිරීම;

(ක) මැණික් කර්මාන්තයේ සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ සේවා නියුක්තයන්ගේ සේවා නියුක්ති නියමයන් සහ කොන්දේසි සහ විශේෂයෙන් එම තැනැත්තන්ගේ ජීවිත සහ ශරීරාංග අනතුරු වලින් ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවරයන් ගැනීම සහ ඒවා විධිමත් කිරීම සහ පාලනය කිරීම

## 03. මුලායය

--------

### 3.1 ද්‍රවශීලතාවය :

වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ රුපියල් මිලියන 55.89 ක්වූ අතර වසර අවසානයේදී එය රුපියල් මිලියන 31.426 ක් විය. කල්පිරීමේ ආයෝජන (භාණ්ඩාගාර බිල්පත්) වල වසර ආරම්භයේදි රුපියල් මිලියන 552.962 ක් වූ අතර එය වසර අවසානයේදී රුපියල් මිලියන 543.76 ක් විය.

වර්ෂය ආරම්භයේදී අනිකුත් මූල්‍ය වත්කම් වටිනාකම රුපියල් මිලියන 779.742 ක් වූ අතර වසර අවසානයේදී එය රුපියල් මිලියන 687.613 ක් විය.

### 3.2 ලාභදායකත්වය :

| | **2011** රුපි.මිලි. | **2012** රුපි.මිලි. | **2013** රුපි.මිලි. | 2014 රුපි.මිලි. | 2015 රුපි.මිලි. | 2016 රුපි.මිලි. |
|---|---|---|---|---|---|---|
| මුළු අදායම | 250.300 | 612.004 | 507.542 | 679.815 | 780.370 | 698.155 |
| මුළු වියදම | 222.488 | 261.076 | 387.458 | 364.873 | 458.385 | 510.950 |
| ලාභය (බදුවලටපෙර) | **27.812** | **350.928** | 120.084 | 314.942 | 321.985 | 187.205 |

## 04. මානව සම්පත්:

2016 වසර අවසානයේදී අධිකාරියෙහි කාර්ය මණ්ඩලය වෘත්තිකයන්ද ඇතුළුව 274 දක්වා ලගාවිය. අඛන්ඩ වෘත්තීයමය සංවර්ධනය ඉහල ප්‍රමුඛස්ථානයේලා සලකනු ලබන අතර. කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සඳහා වර්ෂය තුල රුපියල් මිලියන 3.8 ක පිරිවැයක් දරා තිබුණි.

## 05. බලපත්‍ර නිකුත් කිරීම :

මැණික් කර්මාන්තය සඳහා අධිකාරියෙහි කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයෙන් සහ ප්‍රාදේශීය කාර්යාල මගින් නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව පසුගිය වසර පහක සංඛ්‍යා සමග සසඳා පහත දැක්වේ.

| | **2011** | **2012** | **2013** | **2014** | **2015** | 2016 |
|---|---|---|---|---|---|---|
| මැණික්ගැරීමේබලපත්‍ර | 4,687 | 5,956 | 6,565 | 5,928 | 5,151 | 5,240 |
| මැණික් වෙළඳ බලපත්‍ර | 4,422 | 4,382 | 4,429 | 4.714 | 4,619 | 6,102 |
| මැණික් කැපීමේ බලපත්‍ර | 179 | 177 | 192 | 199 | 204 | 243 |
| මැණික් වෙන්දේසි බලපත්‍ර | 277 | 364 | 624 | 578 | 543 | 491 |
| බලපත්‍ර එකතුව | **9,565** | **10,879** | **11,810** | **11,419** | **10,517** | **12,076** |

06. **අනවසර මැණික් ගැරීම් සහ පාරිසරික හානි පාලනය :**

අනවසර මැණික් ගැරීම් සහ ඒතුලින් සිදුවන පාරිසරික විනාශයන් මැඩපැවැත්වීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී අධිකාරියෙහි නිලධාරීන් වැටලීම් ගණනාවක් සිදුකරන ලදී. දඩ ගැසීම් තුලින් රුපියල් මිලියන 18,670 ක ආදායමක් උපයා ගන්නා ලදී. අත්හැරදමා තිබු මැණික් පතල් වසාදැමීමට හා හාණියටපත් ගංඟා ඉවුරු පුනරුත්ථාපනය කිරීමට අධිකාරිය විසින් පියවර ගන්නා ලදී.

07. වර්ෂය තුලදී බගවන්තලාව වත්තෙහි මැණික් ගැරීමේ විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලද අතර ඉන් රුපියල් මිලියන 109.7 ක අදායමක් උපයා ගන්නා ලදී.

08. **සේවා සහ අනිකුත් සංවර්ධන කාර්යයන්:**

**8.1 අපනයන හා අපනයන සංවර්ධනය.**

-----------------------------------------

1. පහත සඳහන් තෝරාගත් ජ්‍යාතන්තර වෙළඳපොලවල් සහ ප්‍රදර්ශන යන්හීදී "ශ්‍රී ලංකා මණ්ඩපය" සඳහා අනුග්‍රහය දැක්වීම සහ සංවිධානය කිරීම

   i. ජාත්‍යන්තර ස්වර්ණාහරණ ජපාන - ටෝකියෝ (IJT) 2016 ජනවාරි 20 සිට 23 දක්වා
   ii. HKTDC හොංකොං ජාත්‍යන්තර දියමන්ති, මැණික් සහ මුතු ප්‍රදර්ශනය - 2016 මාර්තු 01 සිට 05 දක්වා
   iii. යුරෝපා ස්වර්ණාහරණ වෙළඳ පොල - ජර්මනිය 2016 මාර්තු 19 සිට 22 දක්වා
   iv. ෂැංහයි ස්වර්ණාහරණ ප්‍රදර්ශනය - 2016 මැයි 05 සිට 09 දක්වා
   v. ලාස් වේගාස් JCK ප්‍රදර්ශනය 2016 ජුනි 03 සිට ජුනි 06 දක්වා
   vi. චීනයේ කුංමිං ප්‍රදර්ශනය - 2016 ජුනි 12 සිට 17 දක්වා
   vii. චීන දකුනු ආසියා 13 වන එක්ස්පෝ 2016 – චීනයේ නානිං, ගුංෂි ෂුං ඔටොනොමස් පලාතේ 2016 සැප්තැම්බර් 11 සිට 14 දක්වා
   viii. ලන්ඩන් ජාත්‍යයන්තර ස්වර්ණාහරණ - 2016 සැප්තැම්බර් 06 සිට 08 දක්වා
   ix. එකම රටක ප්‍රදර්ශනය (ශ්‍රී ලංකා මැණික් උත්සවය)- ජපානය 2016 ඔත්තෝබර් 24 සිට 26 දක්වා
   x. චීන ජාත්‍යන්තර ස්වර්ණාහරණ ප්‍රදර්ශනය - බීජිං 2016 නොවැම්බර් 10 සිට 14 දක්වා
   xi. චීන ජාත්‍යන්තර රත්තරන්, ස්වර්ණාහරණ හා මැණික් වෙළඳ පොළ - ෂැංහයි 2016 නොවැම්බර් 18 සිට 21 දක්වා
   xii. වියට්නාම ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාහරණ වෙළඳ පොළ 2016 නොවැම්බර් 09 සිට 13 දක්වා
   Xiii. හොංකොං ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාහරණ ප්‍රදර්ශනය 2016 සැප්තැම්බර් 15 සිට 19 දක්වා

2. ශ්‍රී ලංකාවෙන් පිටතටයන නියෝජිතයන් සංවිධානය කිරීම.

   i. බර්මින්හැම් යන නියෝජිතයන් (UK) 2016 සැප්තැම්බර් 07 සිට 08 දක්වා
   ii. වියට්නාමයට යන නියෝජිතයන් - 2016 ඔක්තෝම්බර් 02 සිට 08 දක්වා
   iii. රුසියා යන නියෝජිතයන් - 2016 මැයි 24 සිට 28 දක්වා

3. විෙද්ශ රටවලින් මෙරටට පැමිණෙන නියෝජිතයන්හට පහසුකම් සැපයීම

   i. චීනයේ පැරණි භාණ්ඩ එකතු කරන්නන්ගේ සංගමයෙන් පැමිණි නියෝජිතයන් - 2016 ජුනි 01
   ii. නිපොන් මාරු වැඩසටහන - 2016 පෙබරවාරි 14සිට 17 දක්වා
   iii. ආසියා පැසිෆික් කලාපයේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් - 2016 අගෝස්තු 01
   iv. රටවල් 23 කින් පැමිණි අනාගත තානාපති නියෝජිතයන් - 2016 අගෝස්තු 4
   v. ශ්‍රී ලංකාවට පැමිණි කසකස්ථාන් රාජ්‍ය තාන්ත්‍රිකයන් 2016 දෙසැම්බර් 13

4. දේශීය වෙළද පොලවල් සහ ප්‍රදර්ශන සඳහා "ජා.මැ.ස්.අ.මණ්ඩපය " මගින් සංවිධානය හා අනුග්‍රහය දැක්වීම.

   i. ENCO 2016 (ඇහැලියගොඩ ජාතික පාසැල) – 2016 ජනවාරි 13 සිට 17 දක්වා
   ii. ශ්‍රී ලංකා සංචාරක රන් ජුබිලිය සැමරීමේ උත්සවය - 2016 මැයි 27 සිට 290 දක්වා
   iii. ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනික ප්‍රදර්ශනය - 2016 සැප්තැම්බර් 08 සිට 10 දක්වා
   iv. හරිත අනාගතය 2016 (පොලොන්නරුව රාජකීය විද්‍යාලය) – 2016 සැප්තැම්බර් 23 සිට 24 දක්වා
   v. හරිත අනාගතය 2016 – (වෙන්කලඩි මධ්‍යම මහා විද්‍යාලය, වෙන්කලඩි) – 2016 සැප්තැම්බර් 27 සිට 28 දක්වා
   vi. ඉදිරි ශ්‍රී ලංකාව බන්ඩාරනායක අනුස්මරණ ශාලාව - 2016 ඔක්තෝබර් 17 සිට 19 දක්වා
   vii. ෆැසෙට් (Facets) ශ්‍රී ලංකා - 2016 සැප්තැම්බර් 01 සිට 04 දක්වා
   viii. ශ්‍රී ලංකා මැණික් විද්‍යාඥයින්ගේ සංගමය මෙහෙයවන ලද “ ජුවෙල්ස් 2016 ” – 2016 දෙසැම්බර් 16 සිට 18 දක්වා
   ix. හාලි ඇල මධ්‍ය මහා විද්‍යාලයේ ප්‍රදර්ශනය - 2016 දෙසැම්බර් 08 සිට 09 දක්වා

5. සුළු හා මධ්‍යම ව්‍යවසායකයින්හට ස්වර්ණාභරණ කර්මාන්තයේ නව උපනතීන් හා ප්‍රමිතීන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙයවීම.
    i. මැණික් හඳුනාගැනීම, ස්වර්ණාභරණ මෝස්තර සැලසුම් කිරීම සහ ස්වර්ණාභරණ නිෂ්පාදනය පිළිබඳ දින 03 ක පුහුණු වැඩසටහන
    ii. ස්වර්ණාභරණ සැලසුම් කිරීමේ දැනුවත් කිරීමේ වැඩසටහන - ගම්පොළ 2016 ඔක්තෝබර් 02

6. ග්‍රාමීය ප්‍රදේශ පදනම් කර ගනිමින් සුළු හා මධ්‍යම ප්‍රමානෙය් ස්වර්ණාභරණ නිෂ්පාදකයින්හට ස්වර්ණාභරණ නිපදවීමේ ආයුධ සහ උපකරණ ලබාදීම.
7. බැංකු කරුවන් සහ පුද්ගලික ආයතන වලට රත්තරන් ආනයනය කිරීමේදී මෙහෙයවිම සහ පහසුකම් සැපයීම.
8. මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රජාවට ඔවුන්ගේ යන්ත්‍ර උපකරණ සහ අමුද්‍රව්‍ය මිලදීගැනීමේදී අවශ්‍ය විදේශ ව්‍යවහාර මුදල් ( ඇමරිකන් ඩොලර් 50,000 ට අඩු ) නිර්දේශ ලිපි නිකුත් කිරීම සහ මෙහෙයවීම.
9. මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ යෙදෙන විදේශීය ව්‍යාපාරික ආයතන සහ පුද්ගලයින්ගේ ඉල්ලීම මත ඔවුනට ශ්‍රී ලංකාවේ රැඳී සිටීමට අවශ්‍ය වීසා ලබාගැනීමට සහ වීසා අලුත් කරවා ගැනීමට නිර්දේශිත ලිපි අදාල අමාත්‍යාංශය වෙත නිකුත් කිරීම.
10. ශ්‍රී ලාංකික මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ නියුතු වුවන්හට වීසා ලබා ගැනීමේ ක්‍රියාවලියේදී අදාල රටවල් වල විසා නිලධාරීන් වෙත විසා ලිපි නිකුත් කිරීම.
11. ශ්‍රී ලංකාව තුල රාජ්‍ය අනුග්‍රහය මත පවත්වාගෙන යනු ලබන මැණික් සහ ස්වර්ණාභරණ වෙළඳ සංකීර්ණ සඳහා "ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ හුවමාරුව" මගින් පහසුකම් සැපයීම සහ ප්‍රවර්ධනය කිරීම.
12. ශ්‍රී ලංකාවේ කුඩා සහ මධ්‍යම පරිමාණ ස්වර්ණාභරණ නිෂ්පාදකයන් හට තමන්ගේ ස්වර්ණාභරණ අයිතමයන් විකිණීමට සහ ප්‍රවර්ධනයට " රත්නදීප" වෙළද කුටි සහ ප්‍රදර්ශනාගාර කළමනාකරණය කිරීම සහ මෙහෙයවීම.
13. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේදී භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය, ආයුධ, යන්ත්‍ර සහ උපකරණ ආනයනය කිරීමේදී සහන බදු අනුපාතයන් යටතේ ආනයනයට සහායවීම.
14. රාජ්‍ය සහ පුද්ගලික අංශයේ නියෝජිතයන් හට ඔවුන්ගේ මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත රාජකාරි හෝ ව්‍යාපාරික දූත ගමන් වලදී පහසුකම් සැපයීම.
15. ජාත්‍යන්තර සගරාවලට දැන්වීම් සැපයීම
    - සෙරන්ඩිබ් සගරාව
    - ජේඑන්ඒ (JNA)

## 09.මැණික් හා ස්වර්ණාභරණ අපනයනය :

පසුගිය වසර පහක  සහ සමාලෝචිත 2016 වසර තුල ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ අපනයනය පිළිබඳ තත්ත්වය පහත දැක්වෙන සංඛ්‍යා මගින් නිරූපනය වේ:

| | **2011** රු. මිලි. | **2012** රු. මිලි. | **2013** රු. මිලි. | **2014** රු. මිලි. | **2015** රු. මිලි. | **2016** රු. මිලි. |
|---|---|---|---|---|---|---|
| මැණික් අපනයන | 10,027.6 | 14,557 | 14,805 | 19,014 | 18,898 | 19,044 |
| මැණික් - NSS විශේෂ ව්‍යාපෘතිය | | | 1,915 | 3,179 | 2,792 | 1,813 |
| ස්වර්ණාභරණ අපනයන | 1,732. | 2,444 | 2,194 | 2,467 | 2,192 | 2,240 |
| ගෙවුඩ අපනයනය | 146.7 | 225 | 122 | 140 | 102 | 103 |
| දියමන්ති ප්‍රති අපනයනය | 45,381.1 | 52,893 | 37,855 | 25,633 | 19,790 | 14,967 |
| දියමන්ති ආභරණ අපනයනය | 375.8 | 324 | 229 | 258 | 315 | 243 |
| මුළු අපනයනය | **57.663.5** | **70,443** | **57,210** | **50,691** | **44,089** | **38,410** |

අසංක වෙළගෙදර

සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි

**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය** ***2017-02-27***

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

අංක 25, ගාලු මුවදොර, කොළඹ 03.

**දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය**

| | සටහන් | 2016 | 2015 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | **3** | 296,612,582.04 | 304,125,489 |
| කල්බදු ඉඩම් (භාවිතයට අයිති) | **4** | 23,634.70 | 25,998 |
| අස්පෘශ්‍ය වත්කම් | **5** | 88,350.32 | 173,300 |
| අනිකුත් වත්කම් | **7** | 371,939,330.58 | 371,939,331 |
| විකිණිය හැකි මූල්‍ය වත්කම් | **8** | 1,200,010.00 | 1,200,010 |
| ප්‍රාග්ධනිත කෙරීගෙන යන වැඩ | | 15,236,226.63 | **1,728,008** |
| අනෙකුත් මූල්‍ය වත්කම් | **14** | 20,000,000.00 | 20,000,000 |
| **ජංගම නොවන වත්කම් එකතුව** | | **705,100,134.72** | **699,192,137** |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොග | **9** | 4,842,109.17 | 4,752,892 |
| ලැබිය යුතු දෑ | **10** | 46,149,307.55 | 41,901,500 |
| කල්පිරෙන තෙක් රදවා ගත් ආයෝජන (HTM) | **11** | 543,761,496.79 | 552,962,322 |
| තැන්පත් සහ අත්තිකාරම් | **12** | 42,189,715.22 | 41,743,012 |
| සේවක ණය සහ අත්තිකාරම් | **13** | 13,230,475.94 | 11,682,493 |
| අනිකුත් මූල්‍ය වත්කම් | **14** | 687,613,759.72 | 779,742,163 |
| මුදල් සහ මුදල් සමානයන් | **15** | 31,426,464.56 | 55,890,007 |
| **ජංගම වත්කම් එකතුව** | | 1,369,213,328.95 | 1,488,674,388 |
| **මුළු වත්කම්** | | **2,074,313,463.22** | **2,187,866,525** |
| **ස්කන්ධ සහ බැරකම්** | | | |
| **ස්කන්ධ** | | | |
| දායක ප්‍රාග්ධනය | **16** | 30,000,000.00 | 30,000,000 |
| මැණික් ගැරීමේ සුභ සාධක අරමුදල | **17** | 28,684,142.71 | 26,748,972 |
| ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල | **18** | 56,075,262.67 | 46,558,763 |
| මැණික් ත්‍යාග අරමුදල | **19** | 45,657,241.09 | 35,150,635 |
| මැණික් ප්‍රත්‍යාගණන සංචිත | **20** | 355,074,648.00 | 355,074,648 |
| ප්‍රත්‍යාගණන සංචිතය | **21** | 52,945,424.11 | 52,945,425 |
| රදවා ගත් ඉපයුම් | | 699,402,926.43 | 735,816,080 |
| **ස්කන්ධ එකතුව** | | **1,267,839,645.01** | **1,285,294,522** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදියාව | **22** | 34,742,935.55 | 39,083,127 |
| විලම්භීත බදු බැදියාව | **6** | 28,620,113.00 | 20,063,344 |
| -කල් බදු ගෙවීමේ බැදියාව - පියවීමේ කාලසීමාව අවුරුද්ද ඉක්මවන | **23.1** | 7,748.00 | 8,208 |
| **ජංගම් නොවන බැරකම් එකතුව** | | **63,370,796.55** | **59,155,679** |

| | | | |
|---|---|---|---|
| **ජංගම බැරකම්** | | | |
| කල් බදු ගෙවීමේ බැදියාව - පියවීමේ කාලසීමාව | **23.1** | 2,130 | 1,809 |
| අවුරුද්ද නොඉක්මවන | | | |
| ගෙවිය යුතු දෑ | **24** | 103,361,586.47 | 158,371,143 |
| මැණික් ගැරීමේ තැන්පතු | | 395,764,276.64 | 390,976,995 |
| ආපසු ගෙවිය යුතු තැන්පත් සහ අත්තිකාරම් | **25** | 108,783,847.24 | 103,940,536 |
| ව්‍යවස්ථාපිත ගෙවීම් | **26** | 91,803,990.36 | 157,208,059 |
| වෙන්කිරීම් සහ උපචිත වියදම් | **27** | 43,387,190.95 | 32,917,783 |
| **ජංගම බැරකම් එකතුව** | | **743,103,021.66** | **843,416,324** |
| **ස්කන්ධ සහ බැරකම් එකතුව** | | **2,074,313,463.22** | **2,187,866,525** |

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ගේ අවශ්‍යතාවයන්ට අනුව මෙම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කර ඇති බවට මූල්‍ය අධ්‍යක්ෂ සහතික කරයි.

----------------------------------

**අධ්‍යක්ෂ (මූල්‍ය)**

මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් ලෙස ගිණුම් ප්‍රතිපත්ති පිටු අංක 16 සිට 28 දක්වා සහ සටහන් පිටු අංක 32 සිට 48 දක්වා ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන 2017 පෙබරවාරි 23 දින අනුමත කර ඒ වෙනුවෙන් අත්සන් කර ඇත.

................................................ ..............................

**සභාපති/ ප්‍රධාන විධායක නිලධාරි** **අධ්‍යක්ෂ**

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

අංක 25, ගාලු මුවදොර, කොළඹ 03.

### 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශණය

| | සටහන් | 2016 | 2015 |
|---|---|---|---|
| **අයභාරය** | **28** | 516,766,249.44 | 580,394,663 |
| **අනිකුත් ආදායම්** | **29** | 80,103,643.41 | 92,356,674 |
| පරිපාලන වියදම් | **30** | (208,400,996.50) | (147,716,987) |
| සේවක වියදම් | **31** | (224,438,476.49) | (218,311,400) |
| ප්‍රවර්ධන වියදම් | **32** | (78,110,483.00) | 92,358,312) |
| මෙහෙයුම් ලාභය | | **85,919,936.86** | **214,364,637** |
| ශුද්ධ මුල්‍ය ආදායම | **33** | **101,285,601.14** | **107,620,077** |
| ශුද්ධ මුල්‍ය ආදායමට පසු ලාභය | | **187,205,538.00** | **321,984,714** |
| ඒකාබද්ධ අරමුදලට දායකය | | **(175,000,000.00)** | **(75,000,000)** |
| බදුවලට පෙර ලාභය | | **12,205,538.00** | **246,984,714** |
| **ආදායම් බදු වියදම්** | **34** | (56,144,925.50) | (130,925,283) |
| වර්ෂය සඳහා ලාභය | | **(43,939,387.50)** | **116,059,431** |
| | | | |
| වර්ෂය සඳහා ලාභය | | **(43,939,387.50)** | **116,059,431** |
| අනිකුත් විස්තීරණ ආදායම් | | - | - |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | | **(43,939,387.50)** | **116,059,431** |

**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය**

**2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්**

**------------------------------------------------------------------------------------------**

## 1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

## 1.1 පිළියෙල කිරීමේ පදනම

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙහි (“අධිකාරිය”) මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට අනුකූලව පිළියෙල කර ඇත. මූල්‍ය වත්කම් ඒවායේ ඓතිහාසික පිරිවැය, ඒවායේ විකුණුම් මත ලබා ගත හැකි සත්‍ය වටිනාකමට පරිවර්තනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. සමහර ගැටළු සහගත ගිණුම් ඇස්තමේන්තු ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතයන්වල (SLFRSs) නියම කර ඇති කරුණු වලට එකගව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරේ. ගිණුම්කරණ ප්‍රමිත අදාල කර ගැනීමේ ක්‍රියාවලියේදී කළමණාකාරීත්වයේ අවශ්‍යතාවය මත තීරණයකර යොදාගැනේ. සංකීර්ණත්වයෙන් විවිධ වූ තීක්ෂණ ලෙස තීරණ ගැනීමේ කරුණු වලදී හෝ මූල්‍ය ප්‍රකාශන වලට වැදගත් වන කරුණු භාරගැනීම හෝ ඇස්තමේන්තු කිරීම ගිණුම් වල හෙළිදරව් කර ඇත.

## 1.2 ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්වීම්

අනිකුත් විදියකින් දක්වා නොමැති නම් පහත සඳහන් කර ඇති ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්වීම්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වලට පරිවර්තනය කිරීම ආරම්භක දිනයට පැවති මූල්‍ය තත්ත්වය ඉදිරිපත් කරන ලද කාල පරිච්ඡේද වලට අදාලව සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන වල ස්ථිරව යොදාගෙන ඇත.

මෙම වර්ෂයේදී මනාලෙස ඉදිරිපත් කිරීම සහ සැසඳීමට හැකිවන පරිදී අවශ්‍ය අවස්ථා වලදී පසුගිය වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇත.

## 1.3 විදේශීය මුදල් පරිවර්තනය කිරීම

### 1.3.1 ඉදිරිපත් කරනු ලබන මුදල් වර්ගය සහ ක්‍රියාකාරීත්වය

මූල්‍ය ප්‍රකාශයන්හී අඩංගු ගණු දෙණු සහ ශේෂයන් ආයතනය ක්‍රියාත්මක වනු ලබන මූලික ආර්ථික පරිසරයේදී භාවිතා කරනු ලබන මුදල් මත ගණනය කර ඇත. අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා රුපියල් මගින් ඉදිරිපත් කර ඇත.

### 1.3.2 ගණුදෙණු සහ ශේෂයන්

විදේශීය මුදල් ගණුදෙණු එකී ගණුදෙණුව සිදුවන අවස්ථාවේ පවතින විදේශ මුදල් හුවමාරු අනුපාතයන් භාවිතා කරමින් ක්‍රියාකාරීත්වයේ පවතින මුදල් වලට පරිවර්තනය කරනු ලැබේ. එකී ගණුදෙණු පියවීමේදී ඇතිවන විදේශ මුදල් හුවමාරු ලාභය හෝ අලාභය සහ වර්ෂය අවසානයේ පරිවර්තනයන් එදිනට පවතින විදේශ මුදල් හුවමාරු වටිනාකම මත මුල්‍ය වත්කම් සහවිදේශ මුදල් මත ඇතිවන බැදීම් විස්තීරණ ආදායම් ප්‍රකාශයන් හී හදුනාගැනේ.
ක්‍රමක්ෂය පිරිවැය වෙනස් වීම් වලට අදාල මුදල් පරිවර්තිත වෙනස්වීම් විස්තීරණ ආදායම් ප්‍රකාශන වලදී හදුනාගැනේ.

### 1.3.3 දේපල, පිරියත හා උපකරණ

කළමනාකාරීත්වය අදහස් කරන පරිදී වත්කම් යම් ස්ථානයක පිහිටුවීමට හෝ ක්‍රියාකාරීත්වයට ගෙන ඒමට දරනු ලබන ඍජුවම ආරෝපිත කල හැකි ඕනෑම පිරිවැයක් දේපල, පිරියත හා උපකරණ වල වටිනාකමට ඇතුලත්ව හදුනාගැනේ.

1998 වර්ෂයට පෙර අත්පත්කර ගත් දේපල, පිරියත හා උපකරණ වල වටිනාකම 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මුල්‍ය තත්ත්ව ප්‍රකාශනවල ප්‍රත්‍යාගණන වටිනාකමට පිළියෙල කර ඇත. ප්‍රත්‍යාගණන වටිනාකම ප්‍රත්‍යාගණනය කරනු ලබන දිනයේදී පැවති සාධාරණ වටිනාකම ලෙස අධිකාරිය විසින් භාරගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ තීරණය කරන ලද පිරිවැය සමුච්චිත ක්ෂවීම් අඩුකිරීමෙන් පසුව භාණ්ඩ පාඩු ලෙස සටහන් කරනු ලැබේ. 1998 වර්ෂයෙන් පසුව අත්පත් කර ගන්නාලද දේපළ, පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂවීම් අඩු කිරීමෙන් පසුව භාණ්ඩ පාඩු ලෙස ගණනය කරනු ලැබේ.

වත්කමක් මිලදී ගැනීමෙන් පසුව දරනු ලබන පිරිවැය එම අයිතමය මගින් අධිකාරියට ගෙනදෙන අනාගත ආර්ථික වාසි සමග ඒකාබද්ධව විශ්වාසයකින් ගණනය කල හැකි නම් එයද වත්කමෙහි වටිනාකම ලෙස හදුනාගනු ලබන අතර, අනිකුත් සියළුම අලුත් වැඩියා සහ නඩත්තු සඳහා දරනු ලබන ගාස්තු එකී වියදම දරනු ලබන කාලපරිච්චේදයට අදාල විස්තීරණ ආදායම් ප්‍රකාශන වල දක්වනු ලැබේ.

ඉඩම් ක්ෂය නොකරනු ලබන අතර අනෙකුත් වත්කම් සරල මාර්ග ක්‍රමය මත ක්ෂය කරනු ලබන අතර පහත සඳහන් අයුරු වත්කමෙහි ඇස්තමේන්තුගත ජීව ආයුකාලය මත එහි ක්ෂයවීම් බෙදාහරිනු ලැබේ.

| **අයිතමය** | **ආයු කාලය** | **ක්ෂය අනුපාතය** |
|---|---|---|
| ගොඩනැගිලි | වසර 30 – 50 | 2% - 3.33% |
| බෙදා වෙන්කිරීම් | වසර 3 | 33.33% |
| පර්යේෂණාගාර හා ස්වර්ණාභරණ පරික්ෂණ | | |
| උපකරණ | වසර 10 | 10% |
| ලී බඩු සහ කාර්යාල උපකරණ | වසර 10 | 10% |
| රථ වාහන | වසර 4 | 25% |
| පරිගණක උපකරණ | වසර 5 | 20% |
| අනිකුත් වත්කම් | වසර 10 | 10% |

වත්කමෙහි ඇස්තමේන්තුගත වටිනාකමට වඩා ඉදිරියට ගෙනයනු ලබන වටිනාකම වැඩිවන්නේ නම්, වත්කමෙහි ඉදිරියට ගෙන එන වටිනාකම පියවාගත හැකි වටිනාකමට ලියා හරිනු ලැබේ.

### 1.3.4. අස්පෘශ්‍ය වත්කම්

පරිගණක වැඩ සටහන් හා පරිගණක පද්ධති අත්පත්කර ගැනීමට හා ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට ගෙන ඒම සඳහා දරනු ලබන පදනම මත පරිගණක වැඩ සටහන් හා පරිගණක පද්ධති ප්‍රාග්ධනිත කරනු ලැබ්. මිලදී ගත් අස්පෘශ්‍ය වත්කම් ඒවා මිලදී ගැනීමට දරන ලද වියදමෙන් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි වූ වටිනාකම අඩුකිරීමෙන් පසු දක්වනු ලැබේ. මෙම පිරිවැය පහත සඳහන් අයුරු ඇස්තමේන්තු ගත ආයු කාලය මත ක්‍රමක්ෂය කරනු ලැබේ**.**

| | | |
|---|---|---|
| පරිගණක පද්ධති | වර්ෂ 5 | 20% |

පරිගණක පද්ධති නඩත්තු සඳහා දරනු ලබන පිරිවැය වියදම් වශයෙන් හඳුනා ගනු ලැබේ.

### 1.3.5. කල් බදු ඉඩම්

කල් බදු යටතේ දරනු ලබන ඉඩම් පලමුවෙන්ම බදු ගෙවීම් වටිනාකම වර්ධනය වන ණය අනුපාතයන් යටතේ වට්ටම්කර එයට ආරම්භක මූලික පිරිවැය හා ඉන් පසුව දරන්නට සිදුවන පිරිවැය එකතුකර වර්තමාන වටිනාකම සමාන වන පරිදි ගණනය කරනු ලබන අතර කල්බදු

ඉඩම් ක්‍රමක්ෂය පිරිවැය අනුව ගණනය කරනු ලැබේ. කල්බදු ඉඩම් වල වටිනාකම කල් බදු කාලසීමාව තුල ක්‍රමක්ෂය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| කල් බදු ඉඩම් | වර්ෂ 30 | 3.33% |

### 1.3.6. මූල්‍ය නොවන වත්කම් වල අගය අඩුවීම

සෑම වාර්තාකරනු ලබන කාල පරිච්චේදයක් අවසානයේදීම අධිකාරිය විසින් දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල අගය පිළිබද විමසා බැලෙන අතර, එම වත්කම්වල අගය අඩු වීමක් පෙන්නුම් කෙරේද යන්න තීරණය ලැබේ. එවැනි ලක්ෂණයක් පෙන්නුම් කෙරේ නම්, එම වත්කම් මගින් ආවරණය කරගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු කර අගය අඩුවීම තීරණය කෙරේ.

විකුණුම් පිරිවැය වත්කමේ සාධාරණ අගයෙන් අඩු කිරීමෙන් පසු ආවරණය වන වටිනාකම වැඩි නම් අගය භාවිතයට ගැනේ. භාවිතා කිරීමේ ඇස්තමේන්තු අගය, අනාගත අස්තමේන්තු මුදල් ප්‍රවාහ වර්තමාන මුදල් ප්‍රවාහ වර්තමාන වටිනාකම අනාගත බදු වට්ටම් අනුපාතයෙන් ගණනය කරන අතර එම මුදල් වල වර්තමාන තක්සේරු අගය හා විශේෂ අවධානම් තක්සේරු කරනු ලැබුවද එය අනාගත මුදල් ප්‍රවාහයට ගැලපීම් නොකෙරේ.

වත්කමෙහි දරනු ලබන වටිනාකම ආවරනය කරගත හැකි ඇස්තමේන්තු වටිනාකමට අඩුනම්, දරනු ලබන වටිනාකම ආවරණය කරගත හැකි වටිනාකම දක්වා වත්කමෙහි වටිනාකම අඩු කරනු ලැබේ. අගය අඩුවීමේ පාඩුව විස්තීර්ණ මුදල් ප්‍රකාශයන්හීදී හදුනාගනු ලැබේ.

## 1.4. මූල්‍ය වත්කම්

### 1.4.1. වර්ගීකරණය

අධිකාරියෙහි මූල්‍ය වත්කම් හදුනාගැනීම අනුව පහත සඳහන් අයුරු වර්ගීකරණය කරනු ලැබේ

i. ණය හා ලැබිය යුතු දෑ

ii. විකුණාගත හැකි දෑ (AFS)

iii. කල්පිරීම දක්වා රදවා ගන්නා වූ ආයෝජන (HTM)

### i. ණය හා ලැබිය යුතු දෑ

ක්‍රියාකාරි වෙළඳ පොලෙහි මිල නියම නොකරන ලද, ස්ථිර හෝ තීරණය නොකරන ලද මූල්‍ය වත්කම් වලින් පැවත එන දෑ ණය හා ලැබිය යුතු දෑ වේ. වාර්තා කරනු ලබන කාල පරිච්චේදය ඉක්මවා මාස 12 ට වැඩි කාලයකින් කල් ඉකුත් වන දෑ හැර අනිකුත් ණය හා ලැබිය යුතු දෑ ජංගම වත්කම් වල ඇතුලත්ව ඇත. වාර්තා කරනු ලබන කාල පරිච්ජේදය අවසානයේ අධිකාරියෙහි පැවති වෙළඳ හා අනිකුත් ලැබිය යුතු දෑ, රාජ්‍ය සුරැකුම් පත් නැවත මිලදී ගැනීම්, තැන්පත්, සේවක ණය හා මුදල් සහ මුදල් සමානදෑ වලින් ණය හා ලැබිය යුතු දෑසමන්විතවේ.

### ii. විකුණාගත හැකි දෑ (AFS)

මෙකී වර්ගයට නියම කරන ලද හෝ වෙනත් කිසිදු වර්ගයකට වර්ගීකරණය නොකරන ලද නමුත් පැවත එන මුල්‍ය වත්කම් විකිණිය හැකි ආයෝජන යටතට ගැනේ. වාර්තා කරනු ලබන කාල පරිච්ජේදයෙන් පසු මාස 12 ක් තුල විකිණීමට තීරණය නොකරන ලද හෝ කල් පිරෙනු ලබන ජංගම වත්කම් ගණයට නොවැටෙන දේ මෙයට ඇතුලත්වේ. විකිණිය හැකි මුල්‍ය වත්කම් දිගුකාලීන ලැයිස්තගත නොවූ ස්කන්ධ ආයෝජනවලින් සමන්විතවේ.

### iii. කල්පිරීම දක්වා රදවා ගන්නා වූ ආයෝජන (HTM)

තීරණය කරනු ලබන හෝ ස්ථිර ගෙවීමක් ලබන සහ ස්ථිරව කල් පිරෙනු ලබන ණය හා ලැබිය යුතු දෑ කල්පිරීම දක්වා රදවා ගන්නා වූ ආයෝජන ලෙස තීරණය කරනු ලැබේ. අධිකාරිය විසින් දැනට කල් පිරෙන තෙක් රදවාගනු ලබන, යහපත් දැක්මක් ඇති නම් එම ආයෝජනයන් කල්පිරීම තෙක් රදවා ගන්නා ආයෝජන ලෙස වර්ගීකරනය කරනු ලැබේ.

මෙම ආයෝජනයන් වාර්තා කරනු ලබන කාල පරිච්ජේදය අවසන් වීමෙන් පසු මාස 12 ක කාලයක් ඉක්මවී කල් පිරෙනු ලබන ඒවා ජංගම නොවන වත්කම් යටතේ වර්ගීකරණය කෙරේ. අධිකාරිය දැනට භාණ්ඩාගාර බිල්පත් වල කර ඇති ආයෝජන මේ යටතට ගැනේ.

### 1.4.2 හඳුනා ගැනීම් සහ මූලික ගණනය කිරීම්

ණය හා ලැබිය යුතුදෑ පිළිබඳ ගණුදෙණුවක් ආරම්භවන දිනයේදී අධිකාරිය විසින් එය මූල්‍ය වත්කම් ලෙස හඳුනාගැනේ. අධිකාරිය මූල්‍ය උපයෝජනය සඳහා ගිවිසුම් වලට එළඹී එහි එක් පාර්ශවකරුවෙකු වන දිනයේදී අනිකුත් මූල්‍ය වත්කම් හඳුනාගැනේ.

මූල්‍ය වත්කමක් එහි සාධාරණ අගයට පෙන්නුම් නොකෙරේ නම්, ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගය කෙලින්ම හුවමාරු කිරීමේ පිරිවැය ස්වභාවයද සැලකිල්ලට ගෙන මූල්‍ය වත්කම් මූලිකව ගණනය කරනු ලැබේ.

මූල්‍ය වත්කම් කල් පිරීම හෝ හුවමාරු කිරීම සිදුවන අවස්ථාවේදී මුදල් ප්‍රවාහයන් ලැබීම හෝ හිමිකම් ඇතිවන අවස්ථාවේදී නැවත හඳුනා ගැනෙන අතර පසුව අධිකාරිය මූල්‍ය වත්කම්වල අයිතිය මත සියළු අවධානම් සහ යහපත් ප්‍රතිඵලයන් මාරු කරනු ලැබේ.

### 1.4.3 දෙවනුව ගණනය කිරීම්

i. **ණය සහ ලැබිය යුතු දෑ**

මූලික හඳුනාගැනීමෙන් පසුව ණය හා ලැබිය යුතු දෑ බල පැවැත්වෙන පොලී අනුපාතයන් මත ක්‍රමක්ෂය පිරිවැය ක්‍රමය භාවිතාකර හානි හා පාඩු සඳහා වෙන් කිරීම් අඩුකර දෙවනුව ගණනය කෙරේ.

ii. **විකුණාගත හැකි දෑ (AFS)**

මූලික හඳුනාගැනීමෙන් පසුව ලැයිස්තු ගත නොවූ ආයෝජන විකුණාගතහැකි මූල්‍ය වත්කම් ලෙස වර්ග කෙරෙන අතර එහි වර්තමාන වටිනාකම නියත වශයෙන් ඇස්තමේන්තු කල නොහැකි විට පිරිවැයෙන් වෙළඳ පල අගය නිසා ඇතිවන අලාභය අඩු කිරීමෙන්ද පසු ගණනය කරනු ලැබේ.

iii. **කල්පිරීම දක්වා රඳවා ගන්නා වූ ආයෝජන (HTM)**

කල් පිරෙන තෙක් රඳවා ගන්නා ආයෝජන ක්‍රමක්ෂය පිරිවැය, බල පැවැත්වෙන පොලී අනුපාතයන් භාවිතා කරමින් වූ ගණනය කිරීම් හානි සහ පාඩු අඩු කිරීමෙන් පසුව ගණනය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේදී හා හුවමාරු පිරිවැය මත වට්ටම් සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂය ගණනය කරනු ලැබේ.

### 1.4.4 මූල්‍ය වත්කම් මත හාණි හා පාඩු

#### I. වත්කම් ක්‍රමක්ෂය පිරිවැය මත දැක්වීම

මූල්‍ය වත්කම් වල වටිනාකම හාණි වී තිබෙන බවට පිලිගත හැකි සාක්ෂි තිබේනම් වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම අධිකාරිය විසින් තක්සේරු කරනු ලැබේ. මූල්‍ය වත්කමක අගය අඩුවී තිබේනම් එම හාණි වීමෙන් සිදුවූ අඩුවීම අඩංගුව ඇති බවට පිළිගත හැකි සාක්ෂි තිබේ නම්ද, වත්කමක් හඳුනාගැනීමෙන් පසු සිද්ධීන් එකක් හෝ කිහිපයක ප්‍රථිඵලයක් ලෙස එය ඇතිවී ඇත්නම් සහ එකී පාඩු අවස්ථාව හෝ අවස්ථාවන් අනාගත ඇස්තමේන්තු ගත මුදල් ප්‍රමාණයන්ට බලපෑමක් සිදු කෙරෙන විට එය පිළිගත හැකි ලෙස ඇස්තමේන්තු කෙරේ.

ණය හා ලැබිය යුතු දෑ කල් පිරෙන තෙක් රඳවා ගන්නා ආයෝජනයන් ඒවායේ හිලව් වන පිරිවැයට ගනු ලබන අතර වත්කම දරනු ලබන වටිනාකම සහ ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයේ වර්තමාන වටිනාකම ( ඇතුලත් නොවූ අනාගත බැර පාඩු හැර) අනුව අලාභය ගණනය කර එම මූල්‍ය වත්කම බල පවත්වන සත්‍ය පොලී අනුපාතය මත වට්ටම් කරනු ලැබේ. මූල්‍ය වත්කම්වල දරනු ලබන අගයෙන් හඳුනාගනු ලබන පාඩු අඩුකර එය විස්තීරණ ආදායම් ප්‍රකාශයන්ට ගණු ලැබේ.

පසු කාල පරිච්ඡේදයේදී හාණි පාඩු වටිනාකම අඩු වන්නේ නම්ද හාණි පාඩු සිදුවීමෙන් පසු අඩුවීම කෙලින්ම බලපානු ලබන්නේ නම්ද, එය හඳුනාගෙන විස්තීර්ණ ආදායම් ප්‍රකාශයන් මගින් පෙර හඳුනාගත් හාණි පාඩු වටිනාකම යථා තත්ත්වයට ගෙන එනු ලැබේ.

#### II විකුණාගත හැකි දෑ (AFS)

මූල්‍ය වත්කමට හාණි පාඩු සිදුවී ඇති බවට පිළිගත හැකි සාක්ෂි තිබේනම් වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම අධිකාරිය එය තක්සේරු කරනු ලැබේ. ලැයිස්තුගත නොකල ආයෝජනයන් සඳහා, ආයෝජනයන්ගේ වටිනාකම සැලකිය යුතු හෝ දිගින් දිගටම පිරිහීම පිළිබද සාක්ෂි ඇත්නම් වත්කමේ අගය අඩු කරනු ලැබේ. මිල නියම නොකල ආයෝජනයන් සඳහා එවැනි සාක්ෂි තිබේනම්, මූල්‍ය වත්කම දරනු ලබන වටිනාකම සහ වෙනත් එවැනි වත්කමක් සඳහා වර්තමාන ඉපයීම් වෙළඳපල අනුපාතය මගින් අනාගත ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහයන් වට්ටම්කිරීමෙන් ලැබෙන වර්තමාන අගය අතර වෙනස ගණනය කර හාණි පාඩු සිදුවූ වටිනාකම ගණනය කරනු ලැබේ. එවැනි හාණි පාඩු යථා තත්ත්වයට පත් කරනු නොලැබේ.

## 1.5 භාණ්ඩ තොග

පලමු ලැබීම් පලමු නිකුත් කිරිම් (FIFO) පදනම මත පිරිවැය තීරණය කර ශුද්ධ උපලබ්ධි අගය හෝ ගත්මිල යන දෙකෙන් අඩු අගය මත තොගයන් දක්වා ඇත. පාරිභෝගික භාණ්ඩ සහ ලිපිද්‍රව්‍ය වලින් තොග සමන්විතවේ.

## 1.6 ලැබිය යුතු දෑ

ලැබිය යුතු දෑ මුලින්ම එහි සත්‍ය වටිනාකම් මත (ඉන්වොයිස් අගය) හදුනා ගැනීමද, ඉන් පසුව මුල් ඉන්වොයිස් වටිනාකම කෙටි කාලයක් තුල ආපසු ලැබෙයයි බලාපොරොත්තුවෙන් වෙළද පල වටිනාකම සලකා එයින් හාණි සදහා අඩු කිරීමද සිදු කරන අතර, මුදල් වල කාලීන වටිනාකම සැලකිල්ලට නොගැනේ.

වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදිම ආපසු ලැබිය යුතු දෑ වල වෙළද පල වටිනාකම වෙනස්වීම් වලට අදාල සාක්ෂි තිබේදැයි අධිකාරිය විසින් තීක්ෂණව තක්සේරු කරනු ලැබේ. අධිකාරියෙහි පසු ගිය අත්දැකිම් අනුව මුදල් එකතු කිරීමේ සහ ලැබීම් ප්‍රමාද සංඛ්‍යාව, ලැබීම්වල අගය අඩුවීමක් තිබේනම් එම හාණි පාඩු ඇතුලත් වන බවට පිළිගත හැකි සාක්ෂි තිබේනම් ලැබිය යුතු දෑ හාණි පාඩු සඳහා වෙන වෙනම තක්සේරු කරනු ලැබේ.

## 1.7 මුදල් හා මුදල් සමානදෑ

මුදල් හා මුදල් සමානදෑ තුල අතැති මුදල්, බැංකු ඒක්ෂණ තැන්පතු, මාස තුනක් හෝ ඊට පෙර කල් පිරෙනු ලබන ආයෝජන සමග අනිකුත් ඉතා ඉහල ද්‍රවශීලතාවයකින් යුත් ආයෝජන මුලීක කල්පිරීමේ වටිනාකම් මත මුදල් ප්‍රවාහ තුල ඇතුලත් කර ඇත.

## 1.8 දායකත්ව ප්‍රාග්ධනය

ශ්‍රී ලංකා මැණික් සංස්ථාව විසින් අධිකාරිය ආරම්භයේදී පවරා දෙනු ලැබූ අගයයන් මගින් ආරම්භක ප්‍රාග්ධනය නියෝජනය වේ.

## 1.9 මූල්‍ය බැරකම්

අධිකාරියෙහි මූල්‍ය බැරකම් අනිකුත් මූල්‍ය බැරකම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. අධිකාරියෙහි අනිකුත් මූල්‍ය බැරකම් වලට ගෙවිය යුතු දෑ, බලපත්‍ර සඳහා ලැබූ අත්තිකාරම්, මැණික් ගැරීමේ තැන්පතු හා අනිකුත් තැන්පත් ලැබීම් ඇතුලත්වේ. මූල්‍ය වත්කම් මුහුණත වටිනාකමට කෙලින්ම හුවමාරු පිරිවැයක් වෙත්නම් එයද ඇතුලත්ව මුලින්ම හඳුනා ගැනේ. මූලික හඳුනාගැනීමෙන් පසුව කෙටි කාලයක් තුලදී ආපසු ගෙවීමට බලාපොරොත්තුවන හිග මුදල්වල මූලික වටිනාකම අනුව ගණනය කර හඳුනා ගැනීම සිදුකෙරේ.

කල් පිරීම, අවලංගු කිරීම, ගිවිසුම් ගත බැඳීම් වලින් නිදහස් වීම වැනි අවස්ථා වලදී අධිකාරිය නැවත මූල්‍ය බැරකම් හඳුනා ගැනේ.

## 1.10 ප්‍රවර්තන හා විලම්භිත බදු

කාල පරිච්ඡේදය තුල දරන ලද බදු වියදම් වල වර්තමාන හා විලම්භිත බදු අඩංගුවේ. අනිකුත් විස්තීරණ ආදායම් අයිතමයන් ප්‍රමාණයන් හැර විස්තීරණ ආදායම් ප්‍රකාශයන් මගින් ආදායම් බදු හඳුනා ගැනේ. මෙම කරුණෙහිදී පවා විස්තීරණ ආදායම් ගිණුම මගින් බදු හඳුනාගැනේ. වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදය අවසානයේදී පවත්නා බදු නීතියට අනුව අධිකාරියෙහි ක්‍රියාකාරීත්වය මගින් උත්පාදනය වන බදු අයවන ආදයම් පදනම මත වර්තමාන බදු ගණනය සිදු කෙරේ. කළමණාකාරීත්වය විසින් සුදුසුතම බදු පදනම යටතේ බදු අධිකාරීන් වෙත ගෙවිය යුතු යැයි බලාපොරොත්තුවන බදු සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ.
මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වත්කම් හා වගකීම් ඒවායේ දරනු ලබන වටිනාකම මත පැන නගින තාවකාලික වෙනස අනුව විලම්භිත බදු වගකීම හඳුනාගැන්. බදු සඳහා ගනන් ගැනෙන ලාභ හෝ පාඩු මගින් ගිණුම් වලට බල පෑමක් සිදු නොවන ගණුදෙණු සිදුවන අවස්ථා වලදී හැර වත්කම් හා වගකීම් සම්බන්ධ ගණුදෙණු සිදුවන අවස්ථාවලදී විලම්භිත බදු ගිණුම් ගත නොකෙරේ. කාල පරිච්ඡේදය අවසන් වන දිනයට බල පවත්වන බදු අනුපාතයන් භාවිතයෙන් වත්කම් හා වගකීම් වල ඉදිරියට ගෙන යන නිරවුල් කලයුතු ශේෂය හා අපේක්ෂිත උපලබ්ධි මුදල මත පදනම්ව විලම්භිත බදු මුදල ගණනය කෙරේ.
අනාගත බදු වත්කම් හා වගකීම් වර්තන බදුවලට එරෙහිව හිලව් කිරීම සඳහා නීතිමය බලාත්මක අයිතියක් තිබේනම්, බදු අධිකාරීන් විසින් ආදායම් බදු පැනවීමේදී ඒ හා සම්බන්ධ වේනම් විලම්භිත බදු වගකීම් වර්තන බදු වගකීම් වලට එරෙහිව ලියා හැරේ.

## 1.11 සේවක ප්‍රතිලාභ

### (අ) නිශ්චිත දායකත්ව සැලසුම්

සේවය අවසන් කිරීමේදී ගෙවනු ලබන ප්‍රතිලාභ වෙනුවෙන් අධිකාරිය විසින් ස්ථිර දායකත්ව මුදලක් වෙනත් ආයතනයක තැන්පත් කිරීම නිශ්චිත දායකත්ව සැලසුමට අයත්වේ. අධිකාරිය තවදුරටත් දායකත්ව ගෙවීම සඳහා නීතිමය හෝ වෙනත් සම්බන්ධිත බැදීම් කිසිවක් නොමැත. සේවක ප්‍රතිලාභ වියදම් ගෙවිය යුතු අවස්ථාවේදී එම දායකයන් හදුනාගැනේ.
සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවකයන්ගේ දළ සේවා පාරිශ්‍රමිකයන් මත 15% දායක මුදලක්ද, සේවා නියුක්තියන්ගේ භාර අර මුදල සඳහා දළ සේවා පාරිශ්‍රමිකයන් මත 3% ක දායක මුදලක්ද අධිකාරිය විසින් දරනු ලැබේ.

### (ආ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම

වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය අවසානයේදී නිශ්චිත ප්‍රතිලාභ වල එදිනට පවතින වටිනාකම මත අධිකාරියෙහි නිශ්චිත ප්‍රතිලාභ බැදීම් සම්බන්ධව ඇති බැදීයාව ගණනය කෙරේ. යෝජිත ඒකක වගකීම් ක්‍රමය අනුගමනය කරමින් ගණනය කිරීම් පාරිතෝෂික සූත්‍රය භාවිතා කරමින් සිදුකර නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් බැදියාව ගණනය කරනු ලැබේ. සේවකයන්ගේ වර්තමාන හා පසුගිය සේවා කාලය සහ උපයාගත් වැටුප අනාගත ඇස්තමේන්තු ප්‍රතිලාභ වල වර්තමාන වටිනාකම ගණනය මත නිශ්චිත ප්‍රතිලාභ බැදිම් තීරණය කරනු ලැබේ.
ගණනය කිරීම් වල වෙනස්වීම් මත පැන නගිනු ලබන ලාභය හෝ පාඩුව ඒවා පැන නගිනු ලබන කාල පරිච්ඡේදය, වර්තමාන සේවා පිරිවැය හා පොලිය විස්තීරණ ආදායම් ප්‍රකාශ වලට ඇතුලත්වේ. විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් සඳහා පිටතින් අරමුදල් සපයා ගණු නොලැබේ.

### (ඇ) කෙටිකාලීන සේවක ප්‍රතිලාභ

සේවකයා විසින් සපයන ලද සේවය පදනම් කරගෙන ගෙවීමට සිදුවෙතැයි අපේක්ෂා කරනු ලබන වට්ටම් නොකරන ලද මුදල මත කෙටිකාලීන සේවක ප්‍රතිලාභ බැදීම ගණනය කරනු ලැබේ.

## 1.12 ප්‍රතිපාදන සහ අසම්භාව්‍ය වගකීම්

නිශ්චිත වශයෙන් ගණනය කල හැකි හා ආර්ථික සම්පත් ඉවතට ගලායාමේ සම්භාවිතාවක් ඇති බව පසුගිය සිද්ධියක ප්‍රථිඵලයක් ලෙස නීතිමය අයුරින් හෝ වටහා ගතහැකි පරිදී වර්තමාන බැදීම් අධිකාරියට ඇතිවිට නීතිමය ඉල්ලීම් මත ප්‍රතිපාදන හා අනිකුත් ක්‍රියාකාරි වියදම් හදුනාගැනේ.

වාර්තාකරනු ලබන දිනය වන විට පිළිගත හැකි සාක්ෂි තිබේනම් හා වර්තමාන බැදීම් සමග අවධානම සහ අවිනිශ්චිතාව සම්බන්ධ වී ඇතුලත්ව තිබේ නම්, වර්තමාන බැදීම් පියවීම සඳහා අවශ්‍යවන ඇස්තමේන්තුගත වියදම් අනුව ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ.

සම්පත් ඉවතට යාමේ සම්භාවිතාවයක් නොමැති නම් සියළු අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් මගින් හෙළිදරව් කර ඇත.

## 1.13 අදායම් හදුනා ගැනීම

ලැබිය යුතු  හා ලැබූ මුදල්වල සාධාරණ අගය සැලකිල්ලට ගෙන ආදායම් ගණනය කරන අතර මැණික් ගැරීමේ අයිතිය අලෙවි කිරීම, බලපත්‍ර ගාස්තු, නිර්යාත කොමිස් හා සේවා සැපයීම් වෙනුවෙන් ලැබිය යුතු මුදල්, එකතු කල අගය මත බදු (VAT) හා ජාතිය ගොඩනැගීමේ බදු (NBT) අඩු කිරීමෙන් පසු දක්වා ඇත. ආදායම් නිශ්චිත ලෙස ගණනය කල හැකි විටදී සහ අධිකාරිය වෙත අනාගතයේදී ආර්ථික පහසුකම් ලගා වේනම් ආදායම් හදුනා ගැනේ.

අධිකාරිය විසින් ප්‍රධාන වර්ගයේ සේවා සැපයිම් වෙනුවෙන් වූ ආදායම් හදුනාගැනීම පහත සඳහන් පරිදී යොදා ගැනේ.

**(අ) මැණික් ගැරීමේ අයිතිය අලෙවිය (ඉඩම් වෙන්දේසි)**

මැණික් ගැරීමේ අයිතිය අලෙවි කිරීමේදී මැණික් ගැරීම සඳහා ඉඩම් කැබලි වෙන්කර බලපත්‍ර ලබාදීම,මිල ගණන් කැදවීමේ ක්‍රමය අනුගමනය කර සිදුකෙරේ. මැණික් ගැරීමේ බලපත්‍ර නිකුත් කරන අවස්ථාවේදී අදායම් හදුනාගැනේ.

**(ආ) බල පත්‍ර ගාස්තු - මැණික් කැපීමේ සහ මැණික් අලෙවි බලපත්‍ර**

බල පත්‍රයේ කාල සීමාව අනුව ඍජු ක්‍රමය යටතේ බලපත්‍ර ගාස්තු ආදායම් හදුනාගැනේ.

**(ඇ) බල පත්‍ර ගාස්තු - මැණික් ගැරීමේ, යන්ත්‍ර මගින් මැණික් ගැරීමේ (BACO) සහ මැණික් වෙන්දේසි බලපත්‍ර**

මැණික් ගැරීමේ බලපත්‍ර නිකුත් කරන අවස්ථාවේදි බලපත්‍ර ගාස්තු ආදායම් හදුනාගැනේ.

**(ඇ) මැණික් හා ස්වර්ණාභරණ නිර්යාත කොමිස් - ( නිර්යාත සේවා ගාස්තු සහ කටුනායක දියමන්ති මධ්‍යස්ථානයේ සේවා ගාස්තු)**

භාණ්ඩ නිර්යාත කිරීමට සුදානම් කල අවස්ථාවේදී නිර්යාත කොමිස් ආදායම් ලෙස හදුනාගැනේ.

**(ඉ) සේවා**

මැණික් ඉඩම් පරීක්ෂා කිරීම වෙනුවෙන් වූ ආදායම් ගෙවීම් ලැබෙන අවස්ථාවේදී ආදායම් ලෙස හදුනා ගැනේ**.**

**(ඊ) කුලී ආදායම්**

බදු කොන්දේසි සැලකිල්ලට ගෙන උපචිත පදනම මත කුලී ආදායම හදුනා ගැනේ.

**(උ) පොළී ආදායම්**

ක්‍රියාත්මක වන පොලී ක්‍රමය මත පොළී ආදායම් හදුනාගැනේ.

**(ඌ) ලාභාංශ ආදායම්**

ගෙවීම් කිරීම තහවුරු කරනු ලබන අවස්ථාවේදී ලාභාංශ ආදායම් හදුනාගැනේ.

**(එ) දේපළ, පිරියත හා උපකරණ ඉවත් කිරීමේදී ඇතිවන ලාභ හෝ පාඩු**

ඉවත් කිරීමේදී ඇතිවන ලාභ හෝ පාඩු තීරණය කිරීම එම වත්කමෙහි දරනු ලබන අගය සහ විකුණා ලැබෙන මුදල සමග සැසඳීමෙන් පසුව විස්තීරණ ආදායම් ප්‍රකාශයන් හීදී සිදුකෙරේ.

**1.14 වියදම්**

වාර්තා කරනු ලබන කාලපරිච්ජේයට අදාලව ලාභ ඉපයීම සඳහා ආයතනයේ මෙහෙයුම් පවත්වාගෙන යාමට දරනු ලබන සියළු වියදම් ඇතුලත්වේ.

**1.15 වාර්තා කරනු ලබන කාලයට පසු සිදුවීම්**

වාර්තා කරනු ලබන කාල පරිච්ජේදයට පසු සිදුවීම් වල ප්‍රමාණාත්මක බව සලකා අවශ්‍ය පරිදී ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශන වල සටහන් මගින් හෙළිදරව් කර ඇත.

## 1.16 බැදීම්

වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය අවසානයේ පවතින සියළු ප්‍රමාණාත්මක බැදීම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වල සටහන් මගින් හෙළිදරව් කර ඇත.

## 1.17 වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු සහ තීරණයන්

මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී කළමණාකාරිත්වය විසින් වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හඳුනා ගැනීමට සහ ඒවා ගණනය කිරීම සඳහා බොහෝ තීරණයන් මත ඇස්තමේන්තු සහ උපකල්පනයන් සිදුකර ඇත.

i. මූල්‍ය ප්‍රකාශනවලට බොහෝ බලපෑම් ඇති කරනු ලබන ගිණුම් ප්‍රමිත භාවිතා කිරීමේදී පහත සඳහන් වැදගත් තීරණයන් ගනු ලැබීය.

(අ) **විලම්භිත බදු වත්කම් හඳුනාගැනීම**

වත්කම්වල අනාගත ප්‍රයෝජනයට ගතහැකි අගයට එරෙහිව අනාගතයේ බදු ආදායමක් ලැබීමේ සම්බන්ධතාවයක් පවතීනම් එම වත්කම් එම ප්‍රමාණයට පමණක් විලම්භිත බදු වත්කම හඳුනාගැනේ.

ii. වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හඳුනාගැනීම සහ ගණනය කිරීම් වලදී බොහෝ වැදගත් සිදුවීම් සඳහා ඇස්තමේන්තු සහ උපකල්පනයන් පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

(අ) **ක්ෂය වන වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය**

වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම ක්ෂය වන වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය ඇස්තමේන්තු කිරීමේදී එම වත්කමෙහි යෝජිත ආර්ථික භාවිතය පදනම්ව කළමනාකාරිත්වය සලකා බලනු ලැබේ. මෙම ඇස්තමේන්තු වලදී තාක්ෂණිකව අභාවයට යෑම පිළිබඳ පරිගණක උපාංග හා පරිගණක මෘදුකාංග වල අවිනිශ්චිතතාවයක් පවතී.

(ආ) **නිශ්චිත ප්‍රතිලාභ සැලසුම**

උපකල්පනයන් ගණනාවක් භාවිතා කරමින් හා සාධක ගණනාවක් සැලකිල්ලට ගනිමින් යෝජිත ඒකක බැර පදනම මත නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් බැදීම් වල වර්තමාන වටිනාකම තීරණය කෙරේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් බැදීම් සහ ශුද්ධ පිරිවැය උපකල්පනය කිරීමේදී යොදාගන්නා වට්ටම් අනුපාතයන් හෙළිදරව් කර ඇත. නිශ්චිත ප්‍රතිලාභ බැදීම් වල වර්තන වටිනාකමට මෙම උපකල්පනයන්ගේ වෙනස්වීම් බලපානු ලැබේ.

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

ශ්‍රී ලංකා රුපියල් වලින්

අංක 25, ගාලු මුවදොර, කොළඹ 03.

### 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

**2.**

| | දායක ප්‍රාග්ධනය | මැණික් ගැරීමේ සුභ සාධක අරමුදල | ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල | මැණික් ත්‍යාග අරමුදල | අනිකුත් සංචිත | මැණික් ප්‍රත්‍යාගණන සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | රඳවාගත් ඉපයුම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2015 ජනවාරි 01 දිනට ශේෂය | **30,000,000** | **27,365,928** | **37,504,763** | **36,033,910** | **-** | **355,074.648** | **52,945,425** | **615,579,700** | **1,154,504,374** |
| සාධාරණ අගයට ගැලපීම් | - | - | - | - | - | - | - | - | - |
| වර්ෂය සඳහා ලාභය | | | | | | | | 116,059,431 | 116,059,431 |
| අනිකුත් විස්තීරණ ආදායම් | - | - | - | - | - | - | - | - | - |
| විස්තීරණ ආදායම් එකතුව | - | - | - | - | - | - | - | - | 116,059,431 |
| පසුගිය වර්ෂයට ගැලපීම් | | | | | | | | 4,176,949 | 4,179,949 |
| වර්ෂය සඳහා දායකත්වය/ (උපයෝජනය) | - | (616,955) | 9,054,000 | 2,116,724 | | - | - | - | 10,553,769 |
| අගය අඩුවීමට ගැලපීම් | | | | | | | | | |
| 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය | **30,000,000** | **26,748,973** | **46,558,763** | **38,150,634** | **-** | **355,074,648** | **52,945,425** | **735,816,080** | **1,285,294,523** |
| සාධාරණ අගයට ගැලපීම් | - | - | - | - | - | - | - | - | - |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | | - | - | - | (43,939,388) | (43,939,388) |
| අනිකුත් විස්තීරණ ආදායම් | - | - | - | - | - | - | - | - | - |
| විස්තීරණ ආදායම් එකතුව | | | | | | | | | (43,939,388) |
| පෙර වර්ෂය සඳහා ගැලපීම් | | | | | | | | 7,526,234 | 7,159,234 |
| වර්ෂය තුල දායකත්වය/ (උපයෝජනය) | - | 1,935,170 | 9,516,500 | 7,506,607 | - | - | - | - | 18,958,276 |
| හානි පාඩු සඳහා ගැලපීම් | - | - | - | - | - | - | - | - | - |
| 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය | **30,000,000** | **8,684,143** | **59,075,263** | **45,657,241** | **-** | **355,074,648** | **52,945,425** | **699,402,926** | **1,267,839,646** |

**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය**

**අංක 25, ගාලු මුවදොර, කොළඹ 03.**

**2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශය**

| | **2016** | **2015** |
|---|---|---|
| බදු වලට පෙර ලාභය | 187,205,538 | 321,984,714 |
| **ගැලපීම්** | | |
| ක්ෂයවීම් | 29,005,476 | 29,476,142 |
| අස්පෘශ්‍යා වත්කම් වල ක්‍රමක් ක්ෂය | 84,950 | 122,866 |
| විශ්‍රාම පාරිතෝෂික බැදීම් | 2,321,531 | 8,389,972 |
| ලාභාංශ | (180,000) | (180,000) |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීමෙන් වූ ලාභ | (316,720) | 44,850 |
| පොලී ආදායම් | (101,310,787) | (107,645,069) |
| කල්බදු ගෙවීම් බැදීම් වලදී ඇතිවූ මූල්‍ය පිරිවැය | 25,186 | 24,992 |
| භාවිතයට අයිති ඉඩම් වල ක්‍රමක්ෂය | 2,364 | 2,364 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය** | 116,837,538 | 252,220,831 |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීම්** | | |
| තොග | **(89,217)** | **(611,083)** |
| ලැබිය යුත දෑ | **(4,247,808)** | **(12,966,352)** |
| තැන්පතු සහ අත්තිකාරම් | **(446,703)** | **2,401,860** |
| ඉදිරි ගෙවීම් | **-** | **-** |
| සේවක ණය සහ අත්තිකාරම් | **(1,547,983)** | **2,425,510** |
| ගෙවිය යුතු දෑ | **(55,009,556)** | **54,429,197** |
| මැණික් ගැරීමේ තැන්පතු | **4,787,282** | **21,064,566** |
| තැන්පතු සහ අත්තිකාරම් ලැබීම් | **4,843,312** | **(2,358,812)** |
| වෙන් කිරීම් සහ උපචිත වියදම් | **10,469,408** | **(15,499,687)** |
| **මෙහෙයුම් වලින් ජනිත මුදල්** | **75,596,272** | **301,076,030** |
| පාරිතෝෂික ගෙවීම් | **(6,661,722)** | **(382,002)** |
| ගෙවූ බදු | **(109,553,229)** | **(133,574,741)** |
| **මෙහෙයුම් වලින් ජනිත ශුද්ධ මුදල්** | **(40,618,679)** | **167,119,287** |

| | | |
|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරකම් තුලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| යන්ත්‍ර පිරියත හා උපකරණ අත්පත්කර ගැනීම | (21,492,799) | (103,247,343) |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීමේදි ලැබීම් | 316,950 | 36,700 |
| ලාභාංශ ලැබීම් | 180,000 | 180,000 |
| අනිකුත් මූල්‍ය වත්කම් වල ශුද්ධ ආයෝජනයන් | (59,430,877) | (34,761,405) |
| භාණ්ඩාගාර බිල්පත් වල ශුද්ධ ආයෝජන | (23,660,877) | (135,157,740) |
| පොලී ලැබීම් | 101,310,787 | 107,645,069 |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනිත (භාවිතා කරන ලද) ශුද්ධ මුදල්** | **(2,776,816)** | **165,304,719** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ප්‍රවාහ** | | |
| මැණික් ගැරීමේ සුභ සාධක අරමුදල් උපයෝජනය | 1,935,171 | (616,955) |
| කල්බදු සඳහා වූ වගකීම් සමථය | (26,325) | (26,325) |
| ස්වර්ණාභරණ සංවර්ධන අරමුදලට දායකය | 9,156,500 | 9,054,000 |
| මැණික් ත්‍යාග අරමුදලට දායකය | 7,506,606 | 2,116,724 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහ** | **18,931,952** | **10,527,444** |
| මුදල් සහ මුදල් සමානයන් ශුද්ධ වෙනස්වීම | **(24,463,543)** | **12,342,012** |
| වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමානයන් | **55,890,007** | **43,547,995** |
| වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමානයන් (සටහන5) | **31,426,465** | **55,890,007** |

# ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

## අංක 25, ගාලු මුවදොර, කොළඹ 03.

### 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

3. **දේපල, පිරියත හා උපකරණ පිරිවැයට**

| **දේපල, පිරියත හා උපකරණ පිරිවැයට** | **2016 ජනවාරි 01 දිනට** | **එකතු කිරීම්** | **ඉවත් කිරීම්** | **ගැලපීම්** | **2015 දෙසැම්බර් 31 දිනට** |
|---|---|---|---|---|---|
| **බැදීම් වලින් නිදහස්** | | | | | |
| ඉඩම් | 37,941,670 | 2,432,389 | - | - | 40,374,059 |
| ගොඩනැගිලි | 158,201,477 | 5,443,333 | - | - | 163,644,810 |
| සවිකිරීම් සහ උපකරණ | 14,491,585 | 1,681,167 | - | - | 16,172,753 |
| ලීබඩු | 13,014,613 | 1,047,470 | - | - | 14,062,083 |
| කාර්යාල උපකරණ | 18,577,237 | 2,219,920 | (297,669) | - | 20,499,488 |
| පරිගණක | 26,110,915 | 2,812,829 | (1,400,219) | - | 27,523,525 |
| රසායනාගාර උපකරණ | 24,069,197 | 420,792 | - | - | 24,489,989 |
| මැණික් කැපීමේ උපකරණ | 403,475 | - | - | - | 403,475 |
| ස්වර්ණාභරණ උපකරණ | 148,200 | - | - | - | 148,200 |
| තත්ත්ව මුද්‍රා උපකරණ | 123,191,248 | 4,502,399 | - | - | 127,693,648 |
| යන්ත්‍ර සහ ගෙවුඩ උපකරණ | 8,292,358 | 932,500 | - | - | 9,224,858 |
| රථ වාහන | 108,582,088 | - | - | - | 108,582,088 |
| යතුරු පැදි | 100,000 | - | - | - | 100,000 |
| පාපැදි | 37,334 | - | - | - | 37,334 |
| මැණික් කැපීමේ පොත් | 5,700 | - | - | - | 5700 |
| **කල් බදු** | | | | | |
| ඉඩම් | 159,205 | - | - | - | 159,205 |
| | **533,326,303** | **21,492,799** | **(1,697,888)** | **-** | **553,121,215** |

| **ක්ෂයවීම්** | **2015 දෙසැම්බර් 31 දිනට** | **වර්ෂයට අදාල** | **(ඉවත් කිරීම්)** | **ගැලපීම්** | **2016 දෙසැම්බර් 31 දිනට** |
|---|---|---|---|---|---|
| **බැදීම් වලින් නිදහස්** | | | | | |
| ගොඩනැගිලි | 44,941,153 | 1,595,325 | - | | 46,536,479 |
| සවිකිරීම් සහ උපකරණ | 12,903,183 | 2,966,651 | - | - | 15,059,834 |
| ලීබඩු | 9,557,486 | 767,174 | - | - | 10,324,660 |
| කාර්යාල උපකරණ | 10,455,070 | 1,458,701 | (297,439) | - | 11,616,333 |
| පරිගණක | 18,248,614 | 2,606,305 | (1,400,219) | - | 19,454,701 |
| රසායනාගාර උපකරණ | 13,751,650 | 1,762,979 | - | - | 15,514,629 |
| මැණික් කැපීමේ උපකරණ | 344,115 | 32,200 | - | - | 376,315 |
| ස්වර්ණාභරණ උපකරණ | 148,200 | - | - | - | 148,200 |
| තත්ත්ව මුද්‍රා උපකරණ | 18,742,888 | 8,583,075 | - | - | 27,325,963 |
| යන්ත්‍ර සහ ගෙවුඩ උපකරණ | 8,292,358 | 70,768 | - | - | 8,363,126 |
| රථ වාහන | 87,602,020 | 9,161,360 | - | - | 96,763,380 |
| යතුරු පැදි | 100,000 | - | - | - | 100,000 |
| පාපැදි | 35,451 | 1,872 | - | - | 37,323 |
| පුස්තකාල පොත් | 936 | (936) | - | - | - |
| | **224,313,124** | **29,005,476** | **(1,697,888)** | **-** | **251,620,943** |

| ශුද්ධ ධාරන අගය | 2016 දෙසැම්බර් 31 දිනට | 2015 දෙසැම්බර් 31 දිනට | | 2014 ජනවාරි 01 |
|---|---|---|---|---|
| **බැදීම් වලින් නිදහස්** | | | | |
| ඉඩම් | 40,374,059 | 37,941,670 | | 37,941,670 |
| ගොඩනැගිලි | 117,108,331 | 113,260.34 | | 119,765,993 |
| සවිකිරීම් සහ උපකරණ | 1,112,919 | 2,398,403 | | 2,533,882 |
| ලිබඩු | 3,737,423 | 3,457,128 | | 3,634,190 |
| කාර්යාල උපකරණ | 8,883,156 | 8,122,167 | | 8,786,874 |
| පරිගණක | 8,068,824 | 7,862,300 | | 9,134,664 |
| රසායනාගාර උපකරණ | 8,975,359 | 10,307,547 | | 11,745,917 |
| මැණික් කැපිමේ උපකරණ | 27,160 | 59,360 | | 91,560 |
| ස්වර්ණාභරණ උපකරණ | - | - | - | - |
| තත්ත්ව මුද්‍රා උපකරණ | 100,367,685 | 104,448,361 | | 11,802,615 |
| යන්ත්‍ර සහ ගෙවුඩඋපකරණ | 861,732 | - | - | - |
| රථ වාහන | 11,818,708 | 20,980,068 | | 36,096,806 |
| යතුරු පැදි | - | - | - | - |
| පාපැදි | 11 | 1,883 | | 1,882 |
| පුස්තකාල පොත් | 5,700 | 4,764 | | 5,700 |
| කල්බදු | | | | - |
| ඉඩම් | 159,205 | 159,205 | | 159,205 |
| | **301,500,272** | **309,013,179** | | **241,700,958** |
| අගය අඩුවීමට ගැලපීම් | (4,887,690) | (4,887,690) | | (4,887,690) |
| | **296,612,582** | **304,125,489** | | **236,,813,268** |

මාර්ග සංවර්ධන අධිකාරියේ හෙළි දරව් කිරීම් අනුව ඇහැළියගොඩ ඉදිකරන ලද ගොඩනැගිල්ල නැවත විකුණා මුදලක් අයකර ගත නොහැකි බැවින් සාධාරණ අගය හාණි සදහා වු ප්‍රතිපාදන වලට මාරු කරන ලදී.

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

අංක 25, ගාලු මුවදොර, කොළඹ 03.

**2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වලට සටහන්**

**4 කල්බදු ඉඩම් - ඉඩම් භාවිතය සඳහා අයිතිය**

කල් බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම ණයට ගැනීම් සඳහා වූ වර්ධනය වන වට්ටම් අනුපාතය මත ගණනය කිරීමෙන් පසු වටිනාකමට කල්බදු ඉඩම් ඉඩම් භාවිතය සඳහා අයිතිය ගණනය කරනු ලැබේ.

| **ඉඩම් භාවිතය සඳහා දරන වටිනාකම** | **2016** | **2015** |
|---|---|---|
| **ප්‍රාග්ධනිත අගය** | | |
| ජනවාරි 01 දිනට | **70,909.00** | **70,909.00** |
| ඇතුලත් මූලික පිරිවැය | - | - |
| වර්ෂයතුල ප්‍රාග්ධනිත කිරීම් | - | - |
| දෙසැම්බර් 31 දිනට | **70,909.00** | **70,909.00** |
| **ක්‍රමක්ෂය** | | |
| ජනවාරි 01 දිනට | **44,910.60** | **42,546.00** |
| වර්ෂය තුල ක්‍රමක්ෂය වීම | 2,364.00 | 2,364.00 |
| දෙසැම්බර් 31 දිනට | **47,274.30** | **44,911.00** |
| **දරනු ලබන වටිනාකම** | **23,634.40** | **25,998.70** |

**ඉඩම්වල කල්බදු අයිතිය 1997 නොවැම්බර් මස ආරම්භ වි අවරුදු 30 දක්වා වේ. කල්බදු කොන්දේසි අනුව 2026 නොවැම්බර් දක්වා වාර්ෂිකව ඉඩම් භාවිතය සඳහා වූ කල්බදු අයිතිය සංක්‍රාන්ති අවධිය වූ (2011 ජනවාරි 01) සිට ඉදිරි කාලය තුල ක්‍රමක්ෂය කරනු ලැබේ.**

| | | | | |
|---|---|---|---|---|
| 5 | **අස්පෘශ්‍ය වත්කම්** | **2016 දෙසැම්බර් 31 දිනට** | **එකතු කිරීම්/ඉවත් කිරීම්** | **2015 දෙසැම්බර් 31 දිනට** |
| | **5.1 පිරිවැයට** | | | |
| | පරිගණක මෘදුකාංග | 2,677,306.00 | - | 2,677,306.00 |
| | **එකතුව** | 2,677,306.00 | - | 2,677,306.00 |

| | | | |
|---|---|---|---|
| | **2016 දෙසැම්බර් 31 දිනට** | **වර්ෂය සඳහා වැය** | **2015 දෙසැම්බර් 31 දිනට** |
| **5.2 ක්‍රමක්ෂය** | | | |
| පරිගණක මෘදුකාංග | 2,588,956.00 | 84,950 | 2,588,956.00 |
| **එකතුව** | 2,588,956.00 | **84,950** | 2,588,956.00 |

| | | |
|---|---|---|
| **5.3 දරණ ශුද්ධ අගය** | **2016 දෙසැම්බර් 31 දිනට** | **2015 දෙසැම්බර් 31 දිනට** |
| පරිගණක මෘදුකාංග | 88,350.00 | 88,350.00 |

| | | | |
|---|---|---|---|
| 6 | **විලම්භිත බදු වත්කම්/(වගකීම්)** | **2016** | **2015** |
| | ජනවාරි 01 දිනට ශේෂය | (20,063,344.00) | (16,923,372.00) |
| | ගැලපීම් | (8,556,769.00) | (3,139,972.00) |
| | දෙසැම්බර් 31 දිනට ට ශේෂය | **(28,620,113.00)** | **(20,063,344.00)** |

| | | | |
|---|---|---|---|
| 7 | **අනිකුත් වත්කම්** | **2015** | **2014** |
| | රළු ගල් සහ සින්තටික් ගල් | 96,682.58 | 96,682.58 |
| | ප්‍රදර්ශන මැණික් ගල් | 371,842,648.00 | 371,842,648.00 |
| | මැණික් සහ මැණික් ආයතන වලට අත්තිකාරම් ගෙවීම් | 200,000.00 | 200,000.00 |
| | | **372,139,330.58** | **372,139,331.58** |
| | හාණි පාඩු සඳහා වෙන්කිරිම් | (200,000.00) | (200,000.00) |
| | | **371,939,330.58** | **371,939,330.58** |

| | | | | |
|---|---|---|---|---|
| 8 | **විකිණිය හැකි (AFS) මූල්‍ය** | | **2016** | **2015** |
| | **වත්කම්** ලැයිස්තු ගත නොකල ආයෝජන | (සටහන් 8.1) | **1,200,010** | **1,200,010** |
| | ලැයිස්තු ගත නොකල ආයෝජන | | | |

| **8.1 ලැයිස්තු ගත නොකල ආයෝජන** | කොටස් සංඛ්‍යාව | | |
|---|---|---|---|
| සීමා සහිත ලංකා එක්සත් පුවත්පත් සමාගම | 200,000 | 200,000 | 200,000 |
| ජී.එස්.එම්.බී. තාක්ෂණික සේවා පුද්ගලික සමාගම | 100,000 | 1,000,000 | 1,000,000 |
| එල්ජීඑල් පුද්ගලික සමාගම | 1 | 10 | 10 |
| | | **1,200,010** | **1,200,010** |

| | | | |
|---|---|---|---|
| 9 | **භාණ්ඩ තොග** | | |
| | පාරිභෝගික භාණ්ඩ | 999,011.54 | 2,340,774.90 |
| | මැණික් - ගෙවුඩ මධ්‍යස්ථානය | 183,547.54 | 183,547.54 |
| | මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය තොග | 3,659,550.09 | 2,228,569.83 |
| | | 4,842,109.17 | 4,752,892.27 |
| 10 | **ලැබිය යුතු දෑ** | | |
| | ලැබිය යුතු දෑ | 44,184,201.48 | 41,065,511.47 |
| | හාණි පාඩු සඳහා වෙන්කිරීම | (1,407,972.00) | (1,407,972) |
| | | **42,776,229.48** | **39,657,539.47** |
| | අනිකුත් | 3,373,078.07 | 2,243,960.21 |
| | | **46,149,307.55** | **41,901,499.68** |
| 11 | **කල් පිරෙන තෙක් වූ ආයෝජන (HTM) ක්‍රමක්ෂය පිරිවැය මත දරන වටිනාකම** | | |
| | භාණ්ඩාගාර බිල්පත් | 543,761,496.79 | 552,962,321.53 |

| | | 2016 | 2015 |
|---|---|---|---|
| 12 | තැන්පතු සහ අත්තිකාරම් | | |
| | පොදු තැන්පත් | 39,799,932.76 | 37,024,684.46 |
| | අනිකුත් | 14,525.00 | 14,525 |
| | නිවාස කුලී අත්තිකාරම් | - | - |
| | ඉඩම් වෙන්දේසි 40% | - | - |
| | ආරක්ෂිත තැන්පතු | 59,500 | 34,500.00 |
| | සැපයුම්කරුවන්ට ගෙවූ අත්තිකාරම් | 3,749,704.46 | 6,103,249.78 |
| | | 43,423,662.22 | 43,176,959.24 |
| | හාණි පාඩු සඳහා වෙන්කිරීම් | (1,433,947.00) | (1,433,947.00) |
| | | 42,189,715.22 | 41,743,012.24 |
| 13 | **සේවක ණය සහ අත්තිකාරම්** | | |
| | අත්තිකාරම් | 168,969.98 | 66.961.28 |
| | වැටුප් රහිත නිවාඩු | 134,864.19 | 142,030.27 |
| | වාහන ණය | 27,186.75 | 53,033.31 |
| | රෙදිපිළි ණය | 136,000.24 | 224,000.24 |
| | ආපදා ණය | 12,763,454.78 | 11,196,467.41 |
| | | **13,230,475.94** | **11,682,492.51** |
| 14 | **අනිකුත් මූල්‍ය වත්කම්** | | |
| | ස්ථාවර තැන්පත් | 670,106,733.38 | 764,439,445.50 |
| | රාජ්‍ය ආයතන තාවකාලික | 17,507,026.34 | 15,302,717.03 |
| | අතිරික්ත අරමුදල | | |
| | | **687,613,759.72** | **779,742,162.53** |
| 15 | **මුදල් සහ මුදල් සමාන දෑ** | | |
| | මුදල් හා බැංකු ශේෂයන් - ශ්‍රී. ලං. රු. | 30,311,026.33 | 34,442,239.93 |
| | බැංකු ශේෂය (විදේශ ව්‍යවහාර මුදල්) | 1,112,438.23 | 562,167.35 |
| | සුළු මුදල් | 3,000.00 | - |
| | භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන | - | 20.885,600.00 |
| | | 31,426,464.5 | 58,890,007.28 |

16. **දායක ප්‍රාග්ධනය**

ශ්‍රී ලංකා මැණික් සංස්ථාව විසින් අධිකාරිය ආරම්භයේදී පවරා දෙනු ලැබූ අගයයන් මගින් ආරම්භක ප්‍රාග්ධනය නියෝජනය වේ.

17. **මැණික් ගැරීමේ සුභ සාධක අරමුදල**

මැණික් කර්මාන්තයේ නියුතු සේවකයන්ගේ ජීවිත අවධානම නිසා ඔවුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් අධිකාරිය විසින් 1993 අංක 50 දරන මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 1 කොටසේ 14 (එන්) වගන්තියට අනුකූලව 2008 වනතුරු මැණික් ගරන්නන්ගෙන් අරමුදල් එකතු කරන ලදී.

18. **ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල**

ස්වර්ණාභරණ කර්මාන්තයේ තාක්ෂණික සංවර්ධනය වෙනුවෙන් 2007 අයවැය යෝජනා අනුව ස්වර්ණාභරණ නිෂ්පාදකයින් ගෙන් වාර්ෂික ලියාපදිංචි ගාස්තුව වූ රු.5,000 බැගින් වූ මුදලින් මෙම අරමුදල සංයුක්තවේ.

19. **මැණික් ත්‍යාග අරමුදල**

1993 අංක 50 දරන මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ iv කොටසේ 52 වගන්තියේ අවශ්‍යතාවය අනුව අධිකාරිය වෙත ලැබෙන අපරාධ වෙනුවෙන් අදාල පාර්ශවයන්ගෙන් අයකරනු ලබන ගාස්තු සහ දඩ මුදල් දඩ අරමුදල වෙත බැර කිරීමෙන් මෙම අරමුදල සමන්විතවේ.

අධ්‍යක්ෂ මණ්ඩල චක්‍රලේක අංක 824 උපදෙස් අනුව වැටලීම් කණ්ඩායම්වලට සහ සේවකයන්ට ත්‍යාග පිරිනැමීම සඳහා මෙම අරමුදල නඩත්තු කෙරේ.

20. **මැණික් ප්‍රත්‍යාගණන සංචිත**

මැණික් ප්‍රදර්ශන වලට ඉදිරිපත් කරනු ලබන මැණික් ගල් ප්රත්‍යාගණනය කිරීමෙන් ඇතිවන අතිරික්ත වලින් සමන්විතවේ.

21. **ප්‍රත්‍යාගණන සංචිත**

ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීම තුලින් ඇතිවන ප්‍රත්‍යාගණන අතිරික්තයන් ගෙන් ප්‍රත්‍යාගණන සංචිතය සමන්විත වන අතර ප්‍රත්‍යාගණනය කරන ලද එකිනෙක වත්කම් ඉවත් කිරීමේදී එම වත්කමට අදාල ප්‍රත්‍යාගණන අතිරික්ත වටිනාකම රඳවාගත් ඉපයුම් වලට මාරු කරනු ලැබේ.

| 22. | **විශ්‍රාම ප්‍රතිලාභ බැදීම්** | **2016** | **2015** |
|---|---|---|---|
| | **ජනවාරි 01 දිනට ශේෂය** | 39,083,126.55 | 31,075,156.25 |
| | විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි වියදම් හඳුනාගැනීමසටහන් 22.1 | 2,321,531.00 | 8,389,972.00 |
| | 2016 වර්ෂයේ ප්‍රතිලාභ ගෙවීම් | (6,661,722.00) | (382,002.00) |
| | 2016 වර්ෂයේ ගැලපීම් | - | - |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **34,742,935.55** | **39,083,126.55** |

22.1 **විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි වියදම්හඳුනාගැනීම**

| | | |
|---|---|---|
| පොලී වියදම | 4,596,176.00 | 3,042,258.00 |
| වර්ෂය තුල අයකිරීම් | 1,633,564.00 | 1,891,744.00 |
| උපකල්පනයන්ගේ වෙනස්වීම් තුලින් පැන නගින (ලාභ)/ අලාභ | (3,908,209.00) | 3,455,970.00 |
| | **2,321,531.00** | **8,839,972.00** |

විශ්‍රාම ප්‍රතිලාභ ගණනය කිරීමේදී අධිකාරියේ කළමනාකාරීත්වය වඩාත් උචිත විචලා ඇස්තමේන්තු පදනම් කරගෙන මෙම උපකල්පනයන් සංවර්ධනය කෙරේ.

**භාවිතා කරනු ලබන මූලික උපකල්පනයන් පහත දැක්වේ**

| | | |
|---|---|---|
| වට්ටම් අනුපාත (%) | 12 | 10 |
| අනාගත වැටුප් වැඩිවීම් සාමාන්‍ය වේතන (%) | 1.3 | 1.3 |
| සේවක පිරිවැටුම් සාධකය (%) | 1.5 | 2.2 |
| විශ්‍රාම යන වයස (අවුරුදු) | 60 | 60 |

දිගුකාලීන රජයේ බැඳුම්කර වෙළඳ අනුපාත පදනම මත වට්ටම් අනුපාත තීරණය කරනු ලැබේ.

23 **කල්බදු ගෙවීම් සදහා වූ වගකීම**

| | 2016 | 2015 |
|---|---|---|
| **දළ වගකීම** | - | - |
| **ජනවාරි 01 දිනට** | 520,589.00 | 546,914.00 |
| වර්ෂය තුල හදුනාගැනීම් | - | - |
| වර්ෂය තුල ගෙවීම් | (26,325.00) | (26,325.00) |
| **දෙසැම්බර් 31 දිනට** | **494,264.00** | **520,589.00** |
| **මූල්‍ය පිරිවැය** | | |
| ජනවාරි 01 දිනට | 509,572.00 | 534,564.00 |
| වර්ෂය තුල හදුනාගැනීම් | - | - |
| වර්ෂය තුල විස්තීරණ ආදායම තුල මූල්‍ය පිරිවැය හදුනාගැනීම | (25,186.00) | (24,992.00) |
| අනාගත කාල පරිච්ඡේදය සදහා මූල්‍ය පිරිවැය ප්‍රතිපාදනය | **484,386.00** | **509,572.00** |
| දෙසැම්බර් 31 දිනට ශුද්ධ බැදීම් | **(9,878.00)** | **(11,017.00)** |

23.1 වගකීම් වර්ගීකරණය

| | | |
|---|---|---|
| වර්ෂයක් තුල පියවිය යුතු | | |
| දළ වගකීම් | 40,175.00 | 26,995 |
| අනාගත කාලපරිච්ඡේද සඳහා මූල්‍ය පිරිවැය ප්‍රතිපාදනය | (38,027.00) | (25,186.00) |
| | **2,130.00** | **1,809.00** |
| වර්ෂයක් ඉක්මවීමෙන් පසු පියවිය යුතු | | |
| පියවීම වර්ෂ දෙක සහ පහ අතර | | - |
| දළ වගකීම් | 157,950.00 | 157,950.00 |
| අනාගත කාල පරිච්ඡේද සඳහා මූල්‍ය පිරිවැය ප්‍රතිපාදනය | (153,943.00) | (153,262.00) |
| | **4,007.00** | **4,688.00** |
| පියවිම වර්ෂ පහ ඉක්මවූ | | |
| දළ වගකීම් | 296,156.00 | 335,643.00 |
| අනාගත කාලපරිච්ඡේද සඳහා මූල්‍ය පිරිවැය ප්‍රතිපාදනය | (292,415.00) | (331,123.00) |
| | **3,741.00** | **4,520.00** |
| වර්ෂයක් ඉක්මවා පියවිය යුතු වගකීම් එකතුව | **7,748.00** | **9,208.00** |
| දෙසැම්බර් 31 දිනට ශුද්ධ වගකීම් එකතුව | **9,878.00** | **11,017.00** |

24 **ගෙවිය යුතු**

| | | |
|---|---|---|
| ණය හිමියෝ | 99,728,762.98 | 155,565,953.92 |
| කොන්ත්‍රාත්කරුවන්ගේ රඳවාගත් මුදල් | 2,758,060,85 | 2,568,872.60 |
| අනිකුත් | 874,762.64 | 236,316.39 |
| | **103,361,586.47** | **158,371,142.91** |

25 **තැන්පතු සහ අත්තිකාරම් ලැබීම්**

| | **2016** | **2015** |
|---|---|---|
| අත්තිකාරම් ලැබීම් | 16,525,400.00 | 18,603,950.00 |
| සේවක ආරක්ෂිත තැන්පතු | 74,500.00 | 74,500.00 |
| ගණුදෙණු කරුවන්ගේ අත්තිකාරම් | 15,896.23 | 15,896.26 |

| | | |
|---|---|---|
| සේවකයන්ගේ වැඩිපුර අයකර ගැනීම් | 6,132.00 | 2,066.00 |
| ඉඩම් ආරවුල් තැන්පතු | 67,549,904.65 | 63,344,856.91 |
| ටෙන්ඩර් තැන්පතු | 5,823,501.00 | 4,569,500.00 |
| ලෝක වෙළඳ මධ්‍ය. වෙලද කුටි රදවා ගැනීම් | 18,382,516.33 | 16,923,769.48 |
| මැණික් කෞතුකාගාර අරමුදල | 125,997.00 | 125,997.00 |
| නිර්යාත කොමිස් තැන්පතු | 280,000.00 | 280,000.00 |
| | **108,783,847.24** | **103,940,535.65** |

26 **ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ**

| | | 2016 | 2015 |
|---|---|---|---|
| සංස්ථාපිත බදු | (සටහන් 26.1) | 32,111,087.13 | 102,866,235.99 |
| එකතුකල අගය මත බදු | | 8,482,815.63 | 4,824,074.35 |
| රදවාගත් බදු | | (11,743,760.65) | (11,743,760.65) |
| රදවාගත් මැණික් වෙනදේසි බදු 2% | | 61,034,063.39 | 56,901,930.93 |
| ජාතිය ගොඩනැගීමේ බදු | | 774,246.77 | 1,858,935.16 |
| මුද්දර ගාස්තු | | 1,417,917.61 | 2,618,983.99 |
| | | (272,379.52, | (118,341.04) |
| | | **91,803,990.36** | **157,208,058.73** |

## 26.1 සංස්ථාපිත බදු

| | | |
|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | 102.866,235.99 | 116,716,513.55 |
| වර්ෂය සදහා වර්ථන බදු | 46,801,384.00 | 127,866,235.62 |
| වර්ෂයතුල ගෙවීම් - පසුගිය වසර බැදීම් පියවීම | (94.553,231.86) | (123,574,741.18) |
| ස්ව තක්සේරු ගෙවීම් | (15,000,000.00) | (10,000,000.00) |
| බදු බැර පියවීම් - ආර්ථික සේවා ගාස්තු | (1,263,841.00) | - |
| - රදවාගත් බදු | - | - |
| - ජාතික බදු | - | - |
| පසුගිය වර්ෂය සදහා වු අධි/(ඌණ) වෙන්කිරීම් මත ගැලපීම | (6,739,460.00) | (8,141,772.00) |
| | **32,111,087.13** | **102,866,235.99** |

27 **වෙන්කිරීම් සහ උපචිත වියදම්**

| | | |
|---|---|---|
| උපචිත වියදම් | 43.387,190.95 | 32,917,783.11 |
| | **43.387,190.95** | **32,917,783.11** |

| 28 | ආදායම් | 2016 | 2015 |
|---|---|---|---|
| | ඉඩම් වෙන්දේසි - රජයේ ඉඩම් | 41,101,459.59 | 9,107,087.50 |
| | ඉඩම් වෙන්දේසි - ඉඩම් ප්‍ර.කොමි. | 49,296,572.28 | 229,489,656.17 |
| | සේවා සහ බලපත්‍ර අභියාචන ගාස්තු | 547,862.95 | 607,556.00 |
| | මැණික් ගැරීමේ බලපත්‍ර ගාස්තු | 32,833,071.79 | 33,643,453.03 |
| | වෙළදාම් බලපත්‍ර ගාස්තු | 44.434.146.77 | 35,728,410.40 |
| | ත්‍යාග සහ සාම්පල් සදහා සේවා ගාස්තු | 469.000.00 | 419,000.00 |
| | මැණික් හා ස්වර්ණාභරණ නිර්යාත සේවා ගාස්තු | 117,910,550.94 | 113,956,667.16 |
| | මැණික් කැපීමේ බලපත්‍ර ගාස්තු | 298,959.32 | 349,980.00 |
| | ගෙවුඩ නිර්යාත සේවා ගාස්තු | 6,508,683.82 | 6,708,634.66 |
| | LDO ඉඩම් සහ බණිජ බද්ද | 3,987.00 | 3,472,067.90 |
| | දඩ මගින් ආදායම් | 18,670,583.32 | 15,756,005.10 |
| | මැණික් වෙන්දේසි බලපත්‍ර | 980,938.54 | 713,716.50 |
| | මැණික් පරීක්ෂා කිරීමේ ගාස්තු | 8,545,529.93 | 10,226,725.10 |
| | තත්ත්ව මුද්‍රා කාර්යාලයේ ආදායම් | 5,037,578.83 | 3,345,765.59 |
| | බලපත්‍ර පිටපත් ගාස්තු | 171,420.00 | 135,223.22 |
| | කටුනායක දියමන්ති මධ්‍යස්ථානයේ සේවා ගාස්තු | 6,415,948.22 | 5,359,927.27 |
| | මැණික් පාර්සල් නිශ්කාශණයෙන් ආදායම් | 1,408,460.00 | 1,830,300.00 |
| | විදේශ විනිමය භාර ගැනීමේ බලපත්‍ර | 4,500.00 | 1,200.00 |
| | පාරිසරික ආරක්ෂණය | 5,078,600.00 | 1,770,000.00 |
| | BACO සේවා ගාස්තු | 10,681,099.20 | 16,179,677.89 |
| | පරීක්ෂණ ගාස්තු | 30,773,580.55 | 38,768,272.48 |
| | ත්‍රිමාන කාඩ් සහ වර්ණ | 2,447,160.00 | 1,635,085.95 |
| | මැණික් වෙළදාම | 109,676,543.00 | 40,746,001.02 |
| | මැණික් ගැරීමේ දඩ | 18,486,600.00 | 10,354,250.00 |
| | | **516,766,249.44** | **580,394,662.94** |

| 29 | අනිකුත් ආදායම් | 2016 | 2015 |
|---|---|---|---|
| | විවිධ ආදායම් | 2,965566.59 | 511,835.11 |
| | ලෝක වෙළද මධ්‍යස්ථානයේ සහ රත්නපුර වෙළදසැල් | 28,863,509.39 | 29,062,220.07 |

| | | | |
|---|---|---|---|
| | පොත් අලෙවිය | 20,850.00 | 10,230.00 |
| | ලාභාංශ | 180,000.00 | 180,000.00 |
| | කුලී ආදායම් | 1,909,351.51 | 951,110.00 |
| | වෙන්දේසි අයිතම වලින් ලද මුදල් | 1,502,950.00 | 1,838,150.00 |
| | ස්ථාවර වත්කම් අලෙවියෙන් ලද ලාභ | 316,720.00 | (44,849.79) |
| | රක්ෂණ නියෝජිතායතන වලින් ලද ආදායම් | 275.232.41 | 393,743.83 |
| | ස්වර්ණාභරණ අලෙවිය | 1.600.388.50 | 1,024,196.05 |
| | ප්‍රදර්ශනන වියදම් - විදේශීව (අයකරගැනීම) | 42,469,075.01 | 58,430,038.53 |
| | | **80,103,643.41** | **92,356,673.80** |
| 30 | **පරිපාලන වියදම්** | 2016 | 2015 |
| | දායක මුදල් | 787,262.52 | 720,444.57 |
| | සංග්‍රහ වියදම් - (දේශීය) | 1,124,996.87 | 587,648.60 |
| | දුරකථන ගාස්තු | 5,984,745.01 | 7,177,338.74 |
| | තැපැල් හා මුද්දර | 1,102,320.79 | 1,037,203.04 |
| | අන්තර්ජාල ගාස්තු | 182,110.61 | 43,852.75 |
| | ටෙලෙක්ස් සහ පැක්ස් ගාස්තු | 81,919.64 | 163,084.86 |
| | අධ්‍යක්ෂ මණ්ඩල වියදම් | 1,365,000.00 | 831,000.00 |
| | කුලී | 8,963,741.15 | 5,306,658,.14 |
| | විදුලිය | 10,944,498350 | 7,919,755.91 |
| | වරිපනම් සහ බදු | 773,193.10 | 857,273.40 |
| | පුවත් පත් සහ වාර සගරා | 168,160.00 | 60,117.00 |
| | ජල ගාස්තු සහ බදු | 1,489,606.44 | 1,179,203.95 |
| | ප්‍රචාරක | 806,680.00 | 848,055.00 |
| | ප්‍රවාහන | 867,157.16 | 456,671.20 |
| | රක්ෂණය | 1,681,203.81 | 2,584,190.56 |
| | නීති වියදම් | 1,979,371.19 | 481,860.73 |
| | වර්ෂය සඳහා විගණන ගාස්තු | 500,000.00 | 600,000.00 |
| | මිනින්දෝරු ගාස්තු | 821,532.64 | 821,670.00 |
| | කළමනාකාරිත්ව උපදේශක ගාස්තු | 525,156.00 | 52,000.00 |
| | ගොඩනැගිලි නඩත්තු | 6,722,204.17 | 5,050,957.76 |

| | | |
|---|---|---|
| උපකරණ නඩත්තු | 1,779,965.03 | 1,838,528.95 |
| ආරක්ෂක සේවා | 10,054,750.00 | 9,446,947.50 |
| වැඩමුළු සහ පුහුණු (දේශීය) | 3,794,471.07 | 3,097,941.93 |
| වැටලීම් වියදම් | 704,823.27 | 725,806.00 |
| සාමාන්‍ය වෙන්දේසි වියදම් | 6,571.774.73 | 3,837,976.57 |
| පරිත්‍යාග | 369,195.00 | 2,790,000.00 |
| පාරිභෝගික වත්කම් | 94,259.87 | 58,980.00 |
| කාර්යාල මිලදී ගැනීම් | 4,296,387.43 | 2,643,354.12 |
| භාවිත ඉඩම් අයිතියේ ක්‍රමක්ෂය | 2,364.00 | 2,364 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 1,442,923.59 | 1,289,736.51 |
| පරික්ෂණාගාර සැපයුම් | 670,915.76 | 553,285.43 |
| පාරිසරික වියදම් | 6,008,516.15 | 5,780,924.06 |
| ක්ෂවීම් | 29,005,476.37 | 29,884,211.03 |
| අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක්ෂය | 84,950.00 | 122,866.00 |
| ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ කුලී | 23,184,169.94 | 21,753,658.40 |
| ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ විදුලිය බිල | 2,370,195.40 | 1,756,047.44 |
| ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ නීතිඥ ගාස්තු | (52,550.40) | - |
| රථ වාහන නඩත්තු | 11,110,911.43 | 4.553,850.53 |
| ඉන්ධන සහ තෙල් | 7,405,272.40 | 6,280,943.24 |
| ටයර් සහ ටියුබ් | 1,023,732.14 | 918,352.60 |
| රථ වාහන රක්ෂණ සහ බලපත්‍ර | 1,558,993.47 | 2,314,362.84 |
| රථ වාහන නැවතුම් ගාස්තු | 300.00 | 130.00 |
| රථ වාහන රක්ෂණ වන්දි | (271,933.13) | (170,934.92) |
| පොදු වියදම් | 3,140,223.17 | 1,013,592.02 |
| ව්‍යාපෘති වියදම් | 37,386,500.27 | 8,960,050.54 |
| බැංකු ගාස්තු | 246,548.22 | 358,498.56 |
| ඉල්ලුම් නොකල ජාතිය ගොඩනැගීමේ බදු | 799,936.12 | 610,797.14 |
| මැණික් ගරන්නන් සඳහා වූ ශිෂ්‍යත්ව වියදම් | 2,415,790.00 | 516,000.00 |
| මැණික් ඉඩම් පුනරුත්ථාපනය | 6,331,275.00 | - |
| | **208,400,996.50** | **147,716,986.70** |

| 31 | සේවක වියදම් | 2016 | 2105 |
|---|---|---|---|
| | වේතන සහ දීමනා | 91,324,431.61 | 82,345,143.30 |
| | වැඩ බැලීමේ දීමනා/අවධානම් දීමනා | 60,776.00 | 74,617.47 |
| | සේවක අර්ථ සාධක යටතට නොගැනෙන වේතන | 37,354,847.94 | 38,904,948.47 |
| | සේවක අර්ථ සාධක අරමුදල | 14,982,456.66 | 12,742,072.00 |
| | සේවක භාරකාර අරමුදල | 2,998,122.75 | 3,069,547.02 |
| | අතිකාල | 3,586,760.89 | 3,982,488.78 |
| | නිවාඩු දින වැඩකිරීම සඳහා ගෙවීම | 253,654.22 | 36,595.50 |
| | ත්‍යාග (රන් පදක්කම්) | - | 209,200.00 |
| | නිවාඩු ප්‍රසාද දීමනා | 5,385,538.88 | 4,740,074.81 |
| | සේවක නිවාස ණය පොලී ගෙවීම් | 229,660.71 | 259,303.71 |
| | සේවක දිරි දීමනා | 33,462,043.46 | 32,593,369.94 |
| | පාරිතෝෂික | 2,321,531.00 | 8,389,971.97 |
| | ගමන් වියදම් (දේශීය) | 2,443,761.05 | 2,859,955.25 |
| | කාර්ය මණ්ඩල නිල ඇඳුම් | 777,396.46 | 736,415.42 |
| | සේවක සුභ සාධන | 11,844,388.71 | 9,837,982,82 |
| | වෛද්‍ය ගාස්තු | 8,860,406.15 | 9,615,213.00 |
| | ප්‍රවාහන දීමනා | 8,552,700.00 | 8,634,500.00 |
| | | **224,438,476.49** | **218,311,400.46** |

| 32 | ප්‍රවර්ධන වියදම් | 2016 | 2015 |
|---|---|---|---|
| | ගමන් වියදම් ( විදේශීය) | 2,243,455.00 | 2,622,003.14 |
| | ප්‍රදර්ශන වියදම් ( දේශීය) | 8,153,254.19 | 6,714,258.48 |
| | ප්‍රදර්ශන වියදම් ( විදේශීය) | 58,501,657.50 | 76,733,818.31 |
| | ප්‍රචාරණය ( දේශීය) | 8,338,440.59 | 3,275,781.22 |
| | ප්‍රචාරණය ( විදේශීය) | 772,375.72 | 945,203.89 |
| | අනිකුත් | 101,300.00 | 2,067,246.85 |
| | | **78,110,483.00** | **92,358,312.19** |

| 33 | **ශුද්ධ මූල්‍ය ආදායම්** | **2016** | **2015** |
|---|---|---|---|
| | **පොලී ආදායම්** | | |
| | ස්ථාවර තැන්පත් සහ භාණ්ඩාගාර බිල්පත් මත පොලී | 100,871,099.08 | 107,155,891.11 |
| | සේවක ණය පොලී | 439,688.06 | 489,117.51 |
| | | **101,310,787.14** | **107,645,068.83** |
| | **පොලී වියදම්** | | |
| | කල් බදු ගෙවීම් බැරකම් මත වූ මූල්‍ය පිරිවැය | (25,186.00) | 24,992.00 |
| | | **(25,186.00)** | **(24,992.00)** |
| | | **101,285,601.14** | **107,620,076.83** |

| 34 | **ආදායම් බදු වියදම්** | **2016** | **2015** |
|---|---|---|---|
| | වර්තමාන බදු වියදම් **(සටහන් 34.1)** | 46,801,384.00 | 127,866,235.62 |
| | පසුගිය වසර සඳහා (ඌණ)/ අධි වෙන්කිරීම් මත ගැලපීම් | 786,772.50 | (80,923.30) |
| | විලම්භිත බදු ගාස්තු/ (වෙනස් කිරීම්) (සටහන් 6) | 8,556,769.00 | 3,139,971.12 |
| | | **56,144,925.50** | **130,925,283.44** |

| **34.1 වර්තන බදු වියදම් සහ ගිණුම් ලාභ ඉපයීම් අතර සැසඳීම්** | **2016** | **2015** |
|---|---|---|
| බදු වලට පෙර ගිණුම් ලාභ | **187,205,538.00** | **321,984,714** |
| ඉඩ නොදෙන අයිතමයන් එකතුව | 37,106,809.00 | 41,953,526 |
| ඉඩ දිය හැකි අයිතමයන් එකතුව | (66,401,376.00) | (61,552,099) |
| අනිකුත් ප්‍රභවයන්ගෙන් ආදායම් | (140,099,856.00) | (145,838,399) |
| වෙළඳ හෝ ව්‍යාපාරික කටයුතු වලින් ලාභ/ (පාඩු) | **17,811,115.00** | **156,547,742** |
| බදු සඳහා අදාල අනිකුත් ආදායම් -පොලී ආදායම් | 139,919,856.00 | 145,658,399 |
| **එකතු ව්‍යවස්ථාපිත ආදායම්** | **157,730,971.00** | **302,206,141** |
| සුදුසුකම් ලබන ගෙවීම් | (157,730,971.00) | (75,000,000) |
| බදු පාඩු උපයෝජනය | - | (1,634,439) |
| **තක්සේරුගත ආදායම්/ බදු අයකල හැකි ආදායම්** | **-** | **255,571,702** |
| ව්‍යවස්ථාපිත බදු රේටයවූ 28% මත බදු ගාස්තු | - | 63,160,077 |
| දළ ලාභාංශ මත බදු | 46,801,384.00 | 64,706,159 |
| වර්ෂය සඳහා සාමාන්‍ය කටයුතු මත වර්තන බදු | **46,801,384.00** | **127,866,236** |

## 35. ප්‍රාග්ධන සහ අනිකුත් බැදීම්

වාර්තාකරණ කාල පරිච්ඡේදය තුල ප්‍රමාණාත්මක ප්‍රාග්ධන වියදම් හෝ අනිකුත් මූල්‍ය බැදීම් කිසිවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නොමැත.

ඇහැලියගොඩ ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධ උපදේශන සහ අනිකුත් වියදම් කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ යටතේ දක්වා ඇත.

## 36. වාර්තාකරණ කාල පරිච්ඡේදයට පසු ඇතිවන සිදුවීම්

2016 වර්ෂය අවසානයේ හද්දුව වත්ත ඉඩම ටෙන්ඩර් කිරීම ප්‍රමානත්මක නොවේ. වාර්තා කරනු ලබන දෙසැම්බර් 31 දින සහ ගිණුම් අත්සන් කරන කාල පරිච්ඡේදය තුල ගැලපීම් සිදුකිරීමට හෝ හෙළිදරව් කිරීමට කාල පරිච්ඡේදයට පසු ඇතිවන සිදුවීම් නොමැත.

## 37. අසම්භාව්‍ය බැරකම්

අධිකාරියෙහි සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු හේතුවෙන් පැන නගිනු ලබන නිත්‍යාණුකූල අසම්භාව්‍ය බැරකම් ඇත. වෙන්කිරීම් ලෙස හදුනාගෙන දක්වා තිබේනම් (සටහන් 27), එම බැදීම් පියවා ඉවත් කිරීමේදී සම්පත් ඉවතට ගලායාම සහ එය සාධාරණීකරනය කලහැකි නම් කළමණාකාරීත්වය එය සැලකිල්ලට ගනු ලැබේ.
අධිකාරියෙහි නීති අංශයේ නීති උපදෙස් මත මෙම ගණනය කිරීම් රදා පවතිනු ඇත.

## 38. සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම

අධිකාරියෙහි සම්බන්ධිත පාර්ශවයන් මහා භාණ්ඩාගාරය, රජයට සම්බන්ධිත ආයතන, රජයට අයත් ව්‍යාපාරික ආයතන සහ ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයින් ගෙන් සමන්විත වේ.
මැණික් හා ස්වර්ණාභරණ නිර්යාත මගින් එකතු කර ගන්නා ලද අරමුදල් සහ ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ සංගමය සමහ එකතුව ලංකා ජෙමලොජිකල් ලැබොරටරි (පුද්ගලික) සාමාගම (Lanka Gemalogicla Laboratory (pvt) Ltd) පිහිටුවා ඇති අතර 2015 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ ශේෂය රු. 126,512,567 ක් විය.

### 38.1 ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයන් හා සිදුවූ ගණු දෙණු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 අනුව "සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම" ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයන්හට කෙලින්ම හෝ වක්‍රව ආයතනයේ කටයුතු සැලසුම් කිරීම, මගපෙන්වීම්, පාලනය කිරීම් පිළිබද වගකීම පැවරී ඇත. ඒ අනුව ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයන් අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස වර්ගීකරණය කෙරේ.

ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයන් සමග සිදුවූ ගණුදෙණු පහත දක්වා ඇත.

| | 2016 | 2015 |
|---|---|---|
| පාරිශ්‍රමික සහ අනෙකුත් කෙටි කාලීන සේවක ප්‍රතිලාභ | 1,200,000 | 1,200,000 |
| සේවා කාලයෙන් පසු ප්‍රතිලාභ | | - |

38.2 **සම්බන්ධිත පාර්ශවයන් හා ගණුදෙණු**

**අධිකාරිය විසින් සම්බන්ධිත පාර්ශවයන් හා සිදුකරන ලද ගණුදෙණු පිළිබඳ වැදගත් තොරතුරු පහත දක්වා ඇත.**

| සම්බන්ධිත පාර්ශවය | වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදය සඳහා කරන ලද ගණුදෙණුවල ස්වභාවය | ගණුදෙණුවේ වටිනාකම | ශේෂය (ගෙවිය/ යුතු)ලැබිය යුතු |
|---|---|---|---|
| රජයට අයිති ව්‍යාපාරික ආයතන | ස්ථාවර සහතික වල සහ භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය | 169,919,145.38 | |
| | ස්ථාවර සහතික සහ භාණ්ඩාගාර බිල්පත් ආපසු ගැනීම් | (110,000,000.00) | 1,213,868,230.00 |
| | ආපසු මිලදී ගතහැකි ආයෝජන (REPO) | 40,000,000 | |
| | ආපසු මිලදී ගතහැකි ආයෝජන (REPO) ආපසු ගැනීම් | 20,000,000 | - |
| අනිකුත් රජය හා සම්බන්ධිත ආයතන | කොටස්වල ආයෝජනය | - | - |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } අයිර්එන්/ඩී/එන්පීජේඒ/1/16 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2017 ජූලි 28 දින

සභාපති,

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය.

**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

පිටපත් - 1. ලේකම් - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

2.ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துாவ வீதி, பத்தரமுல்லை, இலங்கை. · No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } අයිර්එන්/ඩී/එන්ජීජේඒ/1/16 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2017 ජුලි 28 දින

සභාපති,

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය.

**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 21(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂයපථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට් අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මං දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01**

---------------------------------

(I) ප්‍රමිතයේ 32 වගන්තිය අනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මඟින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර ආදායම හා වියදම හිලව් නොකළ යුතු වුවත් මැණික් ගැරීමේ ව්‍යාපෘතිවල රු.173,293,834 ක මුළු ආදායමෙන් රු.3,618,510 ක සේවක දිරිදීමනා හා රු.74,611,635 ක තෙවන පාර්ශව ගෙවීම් ආදායමට හිලව් කර රු. 95,063,689 ක ශුද්ධ ආදායම් පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(II) 66 වගන්තියට පටහැනි ලෙස ගාල්ල මධ්‍යස්ථානය සඳහා වසර 03 කට ඉදිරියට ගෙවන ලද ගොඩනැගිලි කුලී රු.916,667 ක මුළු මුදලම ජංගම වත්කම් ලෙස දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08**

----------------------------------

ප්‍රමිතයේ 49 වගන්තිය පරිදි පෙර වර්ෂ ගැලපුම් රු.7,526,234 ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.36,310,655 ක් වූ වාහන 14 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 17

ප්‍රමිතය ප්‍රකාරව මූල්‍ය කල්බදු ක්‍රමයට මිලදීගෙන තිබුණු වාහන 03 කට අදාල සාධාරණ අගය ගිණුම් ගත කිරීම වෙනුවට ඒ වෙනුවෙන් ගෙවා තිබුණු රු.2,228,028 ක කල්බදු වාරිකවල වටිනාකම පමණක් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19

ප්‍රමිතයේ 57 වගන්තිය පරිදි විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ ගිණුම්ගත කළයුතු පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ යටතේ ඇති වූ ආයුගණක ලාභය (Acturial Gain) වූ රු.3,908,209 ක් සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික වියදමෙන් අඩුකර දක්වා තිබුණි.

## 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව ගොඩනැගිලි සියයට 02 බැගින් හා බෙදා වෙන්කිරීම් සියයට 33.33 බැගින් ක්ෂය වෙන්කළ යුතු වුවද ගොඩනැගිලි හා බෙදා වෙන්කිරීම් එක් අයිතමයක් ලෙස ගෙන සියයට 02 බැගින් රු.1,595,325 ක්ෂය වෙන්කර තිබුණි.

(ආ) ආයතනය විසින් හානිකරණ අලාභ ගැලපීමට අදාළව අනුගමනය කරනු ලබන ගිණුම් ප්‍රතිපත්තිය අනුව සෑම ගිණුම්කරණ කාලපරිච්ඡේදයකදීම දේපළ පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල ඉදිරියට ගෙන යා යුතු වටිනාකම සමාලෝචනය

කර ගිණුම් වලට ගැලපීම් සිදු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබූ අතර අදාල වත්කම් වල හානිකරණ අලාභ ලෙස 2013 වර්ෂයේ සිට රු.6,531,637 බැගින් වූ සමාන ප්‍රමාණයකින් ගිණුම් වලට ගැලපීම් කර තිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නාඋල ප්‍රාදේශීය කාර්යාලයේ අලුත්වැඩියා කටයුතුවලට අදාල නිමකළ වැඩ පිරිවැය රු.4,774,641 ක් වුවද එය කෙරීගෙන යන වැඩ ගිණුමේ රු.10,915,256 ක් ලෙස දක්වා තිබීම නිසා රු. 6,140,615 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) වසර ගණනාවකට පෙර කල්බදු පදනමට ලබාගෙන තිබුණු දැනට භාවිතයේ පවතින වාහන 2 ක වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

(ඇ) ස්ථාවර තැන්පතු 02 ක ලැබිය යුතු පොලී ආදායම රු.100,816 කින් වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

---

ගිණුම් අයිතම 2ක ශේෂවල වටිනාකම් අදාල මූලික වාර්තා සමඟ සැසඳීමේදී රු.4,252,776 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සීතාවක ගඟේ මැණික් ගැරීමේ ව්‍යාපෘති පිළිබඳ පරීක්ෂාවේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) මැණික් ගැරීම් කටයුතු සෘජුවම සිදු කිරීමට අධිකාරියට පනතින් බලතල පවරා නොතිබියදී සීතාවක ගඟේ මැණික් ගැරීම් කටයුතු අධිකාරිය විසින්ම සිදුකර තිබුණි. විධිමත් අනුමැතියක් මත එසේ කළ බව සඳහන් කර තිබුණද එවැනි අනුමැතියක් විගණනට ඉදිරිපත් නොකෙරුණි.

(ii) ව්‍යාපෘතිය බාහිර ව්‍යවසායකයින් මඟින් කරවා ගැනීමට අයදුම්පත් කැඳවා පුවත්පත් දැන්වීමක් පළකිරීමට රු.160,845 ක් වැය කර තිබුණ ද අධිකාරිය විසින්ම ව්‍යාපෘතිය සිදු කිරීම හේතුවෙන් එම වැය කළ මුදල අධිකාරියට පාඩුවක් වී තිබුණි.

(iii) මැණික් ගැරීමේදී මාර්ග සංවර්ධන අධිකාරියේ, මධ්‍යම පරිසර අධිකාරියේ හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුමැතිය හා නිර්දේශය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) ව්‍යාපෘති අධීක්ෂණය සඳහා බාහිර පාර්ශවයන් වෙත අනුමැතියකින් තොරව හා ව්‍යාපෘති ඇස්තමේන්තුවෙන් පරිබාහිරව දිනකට රු.1,000 බැගින් 2016 අගෝස්තු මාසය දක්වා රු.949,000 ක් ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී සේවකයෙකුට රු.6,000 බැගින් වන සේ රු.1,600,000 ක් අලුත් අවුරුදු දීමනා වශයෙන් සභාපතිවරයාගේ අනුමැතිය මත සේවක සුභසාධක සංගමය හරහා ගෙවා තිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ශේෂවල එකතුව රු.205,216 ක් වූ අවුරුදු 03 ඉක්මවූ අගරු වූ චෙක්පත් වටිනාකමක් ඇතුළත්ව තිබුණි.

(ආ) 2014 වර්ෂයේ සිට රඳවාගත් බදු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.11,743,761 ක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනත | |
| (i) 14(1)(උ) වගන්තිය | සීතාවක ගඟේ මැණික් ගැරීම, අමාත්‍ය මණ්ඩල එකඟත්වයකින් තොරව බාහිර පාර්ශවයන්ට පවරා තිබුණි. මෙම ව්‍යාපෘතියේ මුල් අදියර 2 හි අවසන් මාස 10 ට අදාල කටයුතු පාරිසරික ආරක්ෂණ අනුමැතිය රහිතව ක්‍රියාත්මක කර තිබුණි. |
| (ii) 18 (1) වගන්තිය | ඉඩමක "මැණික් ගැරීමේ අයිතිවාසිකම වෙන්දේසියකින් අත්කරගෙන ඇත්තාවූ අවස්ථාවක ඒ තැනැත්තා විසින් ඒ වෙන්දේසියේදී ගෙවන ලද මිලෙහි, ඒ ඉඩමෙන් ලැබෙන මැණික් වලට අදාළව යම් රාජ්‍යභාගයක්ද ඇතුළත් ලෙස සලකනු ලැබිය යුතුය" යන්න දක්වා තිබුණ ද අධිකාරිය එම රාජ්‍යභාග ප්‍රතිශතයන් කුමක්ද යන්න තීරණය කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඉඩම් වෙන්දේසිවලින් රු. 127,812,509 ක පමණ ආදායමක් උපයා තිබුණද ඉන් කිසිදු රාජ්‍යභාග මුදලක් භාණ්ඩාගාරයට ලබා දී නොතිබුණි. |
| (iii) 20(2)වගන්තිය | අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටුකිරීමේදී අධිකාරිය වෙත ලැබෙන සියළු මුදල් අධිකාරියේ අරමුදලට බැර කලයුතු වුවත් ඊට පටහැනිව වැටලීම්, ක්ෂේත්‍ර පරීක්ෂණ හා වෙනත් ආදායම් රු.52,655,943 ක් ත්‍යාග අරමුදලට බැර කර තිබුණි. |

| | |
|---|---|
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනත 11 වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන රු.543,761,497 ක මුදලක් භාණ්ඩාගාර බිල්පත්වල හා රු.670,106,733 ක් ස්ථාවර තැන්පතු ලෙස රාජ්‍ය බැංකුවල ආයෝජනය කර තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 හා 2016 මාර්තු 31 දිනැති 05/2016 රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලට අනුව රු.183,548 ක් වූ ගෙවුඩ තොගය භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි. |
| (ඈ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 5.2.5 වගන්තිය | 2016 වර්ෂයට අදාල අයවැය ලේඛනයේ පිටපත් අදාල අමාත්‍යාංශයට, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට හා විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දී අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.43,939,387 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.116,059,431 ක අතිරික්තයක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.159,998,818 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ මැණික් විකිණීම් ආදායම රු.68,930,542 කින් වැඩි වුවද, ඉඩම් වෙන්දේසි ආදායම රු.148,198,712 කින්, විදේශ ප්‍රදර්ශන සඳහා ලැබීම් රු.15,960,964 කින් හා පරීක්ෂණ සඳහා අය කිරීම් රු.7,994,692 කින් අඩු වීමත්, ව්‍යාපෘති වියදම හා වාහන නඩත්තු වියදම පිළිවෙළින් රු.28,426,450 කින් හා රු.6,557,331 කින් වැඩි වීමත් භාණ්ඩාගාරයට සිදු කළ ගෙවීම් රු.මිලියන 100 කින් වැඩිවීමත් සමාලෝචිත වර්ෂයේ ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

අධිකාරියේ සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ තුනක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට මූල්‍ය අතිරික්තයක්ද සමාලෝචිත වර්ෂයේදී ඌනතාවයක්ද ඇති වී තිබුණි. සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී අධිකාරියේ දායකත්වය 2013 වර්ෂයේ සිට 2016 දක්වා පිළිවෙලින් රු. 273,309,778 ක්, රු. 512,421,306 ක්, රු. 492,320,370 ක් හා රු.263,205,729 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ දායකත්වය සියයට 46 කින් අඩු වී තිබුණි.

**3.2 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අධිකාරියට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් නඩු 22 ක් පවරා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

1993 අංක 50 දරන මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත අනුව අධිකාරියේ ප්‍රධාන අරමුණු සාරාංශ කර පහතින් දැක්වේ.

(i) මැණික් කර්මාන්තය හා ස්වර්ණාභරණ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීම හා ඒ සඳහා යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.

(ii) ඉහත කර්මාන්තවලට අදාළ සෑම අංශයකම සේවකයන්ට කාර්මික පුහුණුව, විශේෂයෙන් තාපයෝජනය සහ මැණික් කැපීම පිළිබඳ පුහුණුව, ප්‍රවර්ධනය සහ අනුග්‍රහය දැක්වීම.

(iii) අනාගත ගැණුම්කරුවන් තුළ කර්මාන්තය කෙරෙහි විශ්වාසය ඇති කිරීමට අවශ්‍ය විය හැකි පියවර ගැනීම හා නීතිවිරෝධී ලෙස මැණික් ගැරීම සහ මැණික් ශ්‍රී ලංකාවෙන් ඉවත් කිරීම වැළැක්වීම.

(iv) රජය සතු ඉඩම්වල මැණික් පතල් කැණීමේ අයිතිවාසිකම අන්සතු කර දීම පිළිබඳ වගකිව යුතු එකම බලධරයා වශයෙන් ක්‍රියාකිරීම හා මැණික් හා ස්වර්ණාභරණ අලෙවි කිරීමට අවශ්‍ය කාර්මික සහ වෙනත් උපදෙස් සහ ආධාර සැපයීම.

(v) මැණික් කර්මාන්තය සම්බන්ධයෙන් අදාළ යම් උපලේඛණගත නීතියක කාර්ය පරිපාලනය කිරීම හා මැණික් සහතික කිරීම සහ වටිනා ලෝහ පරීක්ෂාව සඳහා කාර්යාල පිහිටුවීම සහ ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත ස්වර්ණාභරණ විශේෂ ලකුණකින් මුද්‍රා තැබීමට වගබලා ගැනීම.

(vi) ඉහත කර්මාන්ත සංවර්ධනය සහ සම්බන්ධීකරණය සඳහා එකී කර්මාන්ත හා ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලට අවශ්‍ය සහයෝගය ලබා දීම සහ

(vii) ඉහත කර්මාන්තවල සේවා නියුක්තිකයන් ආරක්ෂා කිරීම සඳහා වූ ආරක්ෂක පියවර විධිමත් කිරීම හා පාලනය කිරීම.

අරමුණු ඉටු කිරීම සම්බන්ධව පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පනතේ සඳහන් ඉහත අරමුණුවලින් අංක (ii), (iii) හා (vi) සංයුක්ත සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ආ) ලංකාවෙන් පිටත මැණික් හා ස්වර්ණාභරණ වෙළෙඳපල පුළුල් කර ගැනීම සඳහා විදේශ ප්‍රදර්ශනවලට අපනයනකරුවන් සහභාගි කරවීම සිදු කළ යුතු වුවත් ඒ සඳහා අපනයනකරුවන් දැනුවත් කිරීම හා දිරිමත් කිරීම සඳහා ප්‍රමාණවත් වැඩපිළිවෙලක් හඳුන්වා දී නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ අපනයන ප්‍රදර්ශන වියදම් ලෙස රු.මිලියන 58.5 ක් දරා තිබුණ ද අපනයනකරුවන් විදෙස් ප්‍රදර්ශණවලට සහභාගී කරවීම තුළින් අපනයන ආදායම වැඩිවී ඇත්ද යන්න පරීක්ෂා කර බැලීමට පසුවිපරම් කිරීමේ වැඩ පිළිවෙලක් නොතිබීම හේතුවෙන් එම වියදමෙහි ඵලදායිත්වය තහවුරු කර ගත නොහැකි විය.

(ඇ) රන් ආනයන කරුවන් සඳහා පහසුකම් සැපයීම, ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ හුවමාරුව සඳහා පහසුකම් සැපයීම හා ප්‍රවර්ධනය, රත්නදීප වෙළඳ කුටිය මෙහෙයවීම හා කළමනාකරණය කිරීම හා ජාත්‍යන්තර සඟරා වල වෙළඳ දැන්වීම් පලකිරීම යන කාර්යයන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඈ) ක්‍රියාකාරකම් 8 ක අපේක්ෂාකළ ඉලක්ක ලබා කරගෙන නොතිබූ අතර ඒවායේ භෞතික කාර්යසාධනය සියයට 20 සිට සියයට 87 ක පරාසයක හා මූල්‍ය කාර්යසාධනය සියයට 2 සිට සියයට 82 ක පරාසයක විය.

(ඉ) අධිකාරියේ ක්‍රියාකාරකම් 7 ක භෞතික කාර්යසාධන ඉලක්ක ළඟා කර ගෙන නොතිබියදී මූල්‍ය කාර්යසාධනය සියයට 124 සිට සියයට 305 දක්වා පරාසයක විය.

(ඊ) ක්‍රියාකාරකම් 2 ක භෞතික කාර්යසාධනය ඉලක්ක ඉක්මවා තිබියදී මූල්‍ය කාර්යසාධනය සියයට 40 ක් හා සියයට 51 ක් වශයෙන් අඩු මට්ටමක විය.

(උ) ක්‍රියාකාරකම් 3 ක භෞතික කාර්යසාධන මට්ටම ලඟා කර ගැනීමේදී මූල්‍ය කාර්යසාධනය ක්‍රියාකාරකම් 2 ක සියයට 50 ක්ද, 1 ක සියයට 22 ක් ද වශයෙන් විෂමව පැවතුණි. තවද ක්‍රියාකාරකම් 2 ක ආදායම් ඉපයීමේ මූල්‍ය හා භෞතික කාර්යසාධනය විශාල ලෙස ඉලක්ක ඉක්මවා තිබුණි.

(ඌ) යාන්ත්‍රික මැණික් පතල්වලින් විශාල වශයෙන් පරිසර හානි නිරීක්ෂණය වූ අතර එම පතල් වලවල්වල පුනරුත්ථාපන කටයුතු දුර්වල මට්ටමක වූ බැවින් පරිසරයට මෙන්ම ජනයාගේ සෞඛ්‍යයට අහිතකර ලෙස බලපා තිබුණි. තවද කුඹුරු ඉඩම් ආශ්‍රිත මැණික් පතල්වලින් එම ඉඩම් වගා කටයුතුවලට යොදාගැනීමට නොහැකි වීමේ අවදානමද ඇති වී තිබුණි. මීට අමතරව, දෝන පතල් වලින් රත්නපුර දිස්ත්‍රික්කයේ නායයාමේ අවදානමක් නිරීක්ෂණය වුවද ඒ පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වටිනාකම රු.210,216 ක් වූ ලැබුණු චෙක්පත් 7ක් අගරු වී වර්ෂ 03 සිට 06 දක්වා කාලයක් ඉක්මවා තිබුණ ද එම මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) රසායනාගාරයක් ආරම්භ කිරීම සඳහා පෞද්ගලික සමාගමක් ස්ථාපිත කිරීම වෙනුවෙන් 2009 වර්ෂයේදී මැණික් අපනයනකරුවන් සහ අධිකාරිය විසින් රු.92,948,578 ක මුදලක් ප්‍රාග්ධන දායකත්වය ලෙස යොදා තිබුනද, විගණිත දිනය වූ 2017 මැයි 31 දක්වාම සමාගම ලියාපදිංචි කිරීම හැර වෙනත් කාර්යයක් ඉටු කර නොතිබුණි. 2016 අගෝස්තු 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාර අදාළ අරමුදල් ආපසු ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඇ) ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 18(2) හා 18(4) වගන්තිය අනුව මැණික් ගැරීමේ ව්‍යාපෘතිවලින් ලැබෙන මැණික් අධිකාරිය වෙත ලබාගෙන ඒවා විකිණීමෙන් ලැබෙන මුදලින් රාජ්‍ය භාගය ලෙස කොටසක් වෙන්කළ යුතු වුවත් බොගවන්තලාව සහ සීතාවක ගඟ සමස්ථ ව්‍යාපෘති මගින් උපයා තිබූ රු. 184,551,611 ක මුදලින් කිසිදු මුදලක් රාජ්‍ය භාගය ලෙස භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඈ) ආදායම් බදු ගණනය කිරීමේදී , ඒකාබද්ධ අරමුදලට සිදුකරන ලද රු.මිලියන 175 ක ගෙවීම නොසලකා තිබීම හේතුවෙන් රු.43,750,000 ක ආදායම් බදු වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) අභ්‍යන්තර විගණක විසින් සිදුකරන ලද විගණන හා විමර්ශන කාර්යයන් ඇසුරෙන් ඉදිරිපත් කර තිබූ ඇතැම් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බොගවන්තලාව වැපල්ටන්වත්තේ මැණික් ඉඩම් වෙන්දේසි කර නිකුත් කරන ලද මැණික් ගැරීමේ බලපත්‍ර පිළිබඳ සිදුකළ නියැදි පරීක්ෂණයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ඉඩම් කැබලි අංක 51 සඳහා සභාපතිවරයාගේ අනුමැතිය නොමැතිව බලපත්‍ර නිකුත් කර තිබුණි. බලපත්‍රලාභියා බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කරමින් අනවසර පතල් කැපීම් සිදු කර තිබුණද, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන 2016 මැයි 20 සිට වර්ෂයක් සඳහා මැණික් ගැරීමේ බලපත්‍රය නැවත දීර්ඝ කර දී තිබුණි.

(ii) කෙසෙල්ගමු ඔයෙහි මැණික් ගැරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය ලබා දී තිබූ පාරිසරික අනුමැතිය 2016 ජූලි 21 අවසන්ව තිබියදී, රක්ෂිත සීමාව තුල පස්තවටු ඉවත් කිරීම සඳහා ඉඩම් කැබලි 5 ක බලපත්‍ර ලාභීන්ට අධිකාරිය විසින් නැවත අවසර ලබා දී තිබුණි.

(iii) පතල් බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කරමින් එකම වරද සිදු කළ සියළුදෙනාටම ඒකාකාරී හා සමාන පදනමක් මත කටයුතු කර දඩ මුදල් හා අලාභ අය කර නොතිබුණි. අයකරගත් අලාභ පරිසරය යථා තත්වයට පත් කිරීමට යොදවා නොතිබුණි..

(ආ) අධිකාරියේ සේවකයන්ට ගෙවන ලද රු.33,488,255 ක් වූ දිරි දීමනා සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2001 වර්ෂයේදී භාණ්ඩාගාරය විසින් උපදෙස් ලබාදී තිබූ පරිදි කාර්යසාධනය පදනම් කරගෙන දිරිදීමනා ක්‍රමයක් සකස් කර නොතිබුණි.

(ii) භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමෙන් පසුව 2016 වර්ෂයේ දිරිදීමනා ගෙවන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය නියෝග කර තිබියදී ඊට පටහැනිව අනුමැතිය ලබාගැනීමකින් තොරව රු.33,488,255 ක් ගෙවීම් කර තිබුණි.

(iii) 2001 වර්ෂයේදී භාණ්ඩාගාරය අනුමත කර තිබූ දිරි දීමනා ක්‍රමවේදයට අනුව පොදු සංචිත යටතේ සේවකයෙකුට ගෙවිය හැකි උපරිම මුදල රු.10,000 ක්ව තිබිය දී, අනුමැතිය රහිතව රු.58,000 ක් බැගින් ගෙවීම හේතුවෙන් රු.11,952,000 ක් ද, මූලික වැටුප වෙනුවට දළ වැටුප පදනම් කරගෙන ගෙවා තිබීම හේතුවෙන් රු.5,202,819 ක් ද වැඩිපුර ගෙවා තිබුණි.

(iv) දිරි දීමනා ගෙවීමේ දී කිසිදු කාර්යසාධන නිර්ණායකයක් පදනම් කරගෙන නොතිබූ අතර හිමි නිවාඩු ඉතිරිකර ගැනීම පමණක් සලකා බලා තිබුණි. පැවති දිරිදීමනා ක්‍රමය අනුව වර්ෂයකට දින 21 ක් ඉක්මවා ලබාගන්නා ලද නිවාඩුවලට සමානුපාතිකව දිරිදීමනා අඩුකළ යුතුය. සමාලෝචිත වර්ෂයට අදාල දිරිදීමනා එම වර්ෂයේම දෙසැම්බර් ගෙවා තිබීම හේතුවෙන් වර්ෂයට අදාළ මුළු නිවාඩු සැලකිල්ලට ගෙන නොතිබුණි.

(v) දිරි දීමනා සඳහා වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන පදනම් කරගත යුතු වුවද ඇස්තමේන්තුගත මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.43,939,387 ක බදු පසු අලාභයක් වාර්තා කර තිබිය දී වාර්ෂික දිරි දීමනා ගෙවා තිබුණි.

(vi) මැණික් ගැරීමේ ව්‍යාපෘතිවල ශුද්ධ ආදායමෙන් රු.3,618,510 ක් සමාලෝචිත වර්ෂයේදී දිරිදීමනා ලෙස සියළු සේවකයන්ට ගෙවා තිබිය දී, වාර්ෂික දිරිදීමනා ගෙවීමේදී ද ව්‍යාපෘති ආදායම සලකා බලා තිබීම නිසා එම ආදායම දිරිදීමනා ගෙවීමේදී දෙවරක් පදනම් කරගෙන තිබුණි.

## 4.4 අක්‍රිය බැංකු ගිණුම්

අධිකාරියේ බැංකු ගිණුමක් 2015 සැප්තැම්බර් සිට අක්‍රියව පැවතුනු අතර එහි රු.325,676 ක ශේෂයක් විය.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය 282ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලයට 274 ක් විය. මෙකී තථ්‍ය කාර්ය මණ්ඩලය තුළ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවන අනියම් සේවකයින් 15 ක් හා කොන්ත්‍රාත් සේවකයෙක්ද ඇතුළත්ව තිබුණි.

(ආ) අනුමත සුළු සේවක සංඛ්‍යාව 61 ක්ව තිබියදී එම සීමාව ඉක්මවා සේවකයින් 5ක් ස්ථිර කාර්ය මණ්ඩලයට බඳවාගෙන තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාර ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත ගිණුම් සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2017 මැයි 31 දක්වා 2016 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

## 5.2 සංයුක්ත සැලැස්ම

සමාලෝචිත වර්ෂය ඇතුළත්ව පිළියෙළ කර තිබූ අධිකාරියේ සංයුක්ත සැලැස්ම 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය ප්‍රකාර යාවත්කාලීන කර නොතිබුණි.

## 5.3 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරාගැනීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි.

## 5.4 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 133(2) ප්‍රකාර අභ්‍යන්තර විගණන අංශය විසින් ආයතනයේ ගිණුම් වාර්තා, උපලේඛණ හා සටහන්වල විශ්වාසදායකත්වය පරීක්ෂා කළ යුතු වුවද ඒ සම්බන්ධ පරීක්ෂාවන් අභ්‍යන්තර විගණන සැලැස්මට ඇතුළත් කර විගණනයට ලක් කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණක, මුදල් රෙගුලාසි 134 (1) හා 2009 ඔක්තෝබර් 07 දිනැති අංක ඩීඑම්ඒ/2009(3) දරණ කළමනාකරණ විගණන දෙපාර්තුමේන්තු චක්‍රලේඛයේ සඳහන් අභ්‍යන්තර විගණන ප්‍රමිති අංක 1120 ට මෙන්ම විගණන ආචාරධර්වලට ද පටහැනි ලෙස හා ස්වාධීනත්වයට හානි වන ලෙස අධිකාරියේ මැණික් වෙන්දේසි හා වැටලීම් අංශයේ කටයුතු සඳහා සම්බන්ධවී ඒ සඳහා දීමනාද ලබාගෙන තිබුණි. තවද, අභ්‍යන්තර විගණකවරයා සහභාගී වී තිබූ ඇතැම් රාජකාරී කටයුතු පිළිබඳ පරීක්ෂාවන් අභ්‍යන්තර විගණන සැලැස්මට ඇතුළත් කර හෝ විගණනයට භාජනය කර නොතිබීම ද නිරීක්ෂණය විය.

(ඇ) අභ්‍යන්තර විගණන අංශය සඳහා අතිරික්ත නිලධාරීන් දෙදෙනෙකු ද සේවයේ යොදවා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්මේ කාර්යන් 35 ක් වර්ෂය තුල ඉටු කර නොතිබුණි.

## 5.5 කොන්ත්‍රාත් හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය

කැළණිගඟ හද්දුව වත්ත ආශ්‍රිතව අනවසර මැණික් ගැරීම වැළක්වීම සඳහා ඒකාබද්ධ මැණික් ගැරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබූ අතර ඒ සඳහා පෞද්ගලික ව්‍යවසායකයෙකු සම්බන්ධ කර ගැනීම සඳහා පුවත්පත් මගින් මිල ගණන් කැඳවා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ව්‍යාපෘතිය සඳහා තීරණය කර තිබූ අවම ලංසුව රු.40,000,000 ක් වූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.13 (ii) මාර්ගෝපදේශයට අනුව ඒ සඳහා ලබාගත යුතු ලංසු සුරක්ෂණය රු.200,000 ත් රු.400,000 ත් අතර විය යුතු වුවද රු.1,000,000 ක ලංසු සුරක්ෂණයක් ලබා ගෙන තිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.10.1 මාර්ගෝපදේශ්‍ය ප්‍රකාරව ලංසුකරුවන්ගේ මූල්‍ය ශක්‍යතාවය ඇගයීමකින් හා මැණික් ක්ෂේත්‍රයේ පළපුරුද්ද තහවුරු කර ගැනීමකින් තොරව තෝරාගත් කොන්ත්‍රාත්කරු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් අනවසර මැණික් ගරන්නන්ගෙන් භූමිය ආරක්ෂා කර ගැනීමට අමතර පිරිවැයක්ද අධිකාරියට දැරීමට සිදු වී තිබුණි.

## 5.6 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

අයවැය ගත හා තත්‍ය ආදායම් අතර සියයට 11 සිට සියයට 80 දක්වා හා අයවැය ගත හා තථ්‍ය වියදම් අතර සියයට 11 සිට සියයට 7371 දක්වා පරාසයක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායි කළමණාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5.7 නොවිසඳී ඇති විගණන ඡේද

------------------------------

ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 9.1 වගන්තියට පටහැනිව වයස අවුරුදු 60 ඉක්මවූ නිළධාරියෙකු අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත කොන්ත්‍රාත් පදනම යටතේ උපදේශකවරයෙකු ලෙස 2012 ඔක්තෝබර් සිට සේවයේ යොදවා තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | රැස්කරනු ලබන මුදල් අප්‍රමාදව බැංකුගත නොකිරීම හා පොත්පත් පවත්වාගෙන නොතිබීම |
| (ආ) මෙහෙයුම් පාලනය | (i) වැටලීම්වලට අදාළ තොරතුරු පවත්වා ගැනීම, වාර්තාකරණය හා රාජසන්තක කරනු ලබන භාණ්ඩ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබීම. |
| | (ii) සහතිකපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත් නොකිරීම. |
| | (iii) මු.රෙ. 169(2) ප්‍රකාරව කටයුතු නොකිරීම. |
| | (iv) පරිගණක පද්ධතිය නිතර අක්‍රියවීම නිසා කුවිතාන්සි පොත් භාවිතා කිරීමට සිදුවීම සහ විධිමත් පරිදි ගබඩා නොකිරීම. |
| (ඇ) තොග පාලනය | (i) තොග ලෙජරයේ ශේෂය හා භෞතික තොගය අතර ඌනතාවයන් හා අතිරික්තයන් පැවතීම. |
| | (ii) අධිකාරියේ භාණ්ඩ මිලදීගැනීම් හා අබලි ද්‍රව්‍ය වෙන්දේසි කිරීමත් ගබඩා අංශය පවත්වාගෙන යාමත් සැපයුම් කළමනාකරු යටතේම සිදුකර තිබීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | (i) සේවකයින්ගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් තහවුරු කර නොගැනීම. |
| | (ii) විධායක නොවන මට්ටමේ නිළධාරීන්ගේ කාර්යසාධනය වාර්ෂිකව ඇගයීමට ලක් නොකිරීම. |
| | (iii) පුරප්පාඩු සඳහා බඳවා නොගැනීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති